# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,891 — 1970 ජනවාරි 29 වැනි බ්‍රහස්පතින්දා — 1970.1.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 147 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 156 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 157 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 176 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 179 | විවිධ දැන්වීම් ... ... ... ... | |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ජෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර), ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියලුම නීතිරීති හා ව්‍යවස්ථා

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 14 වැනි දින,
ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

වලටත් මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

(iii) (අ) ඔවුන් ස්වකීය රාජකාරි කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අත්‍යවශ්‍යක නොවන්නාවූ අති විශේෂ අවස්ථාවන්හිදී හැර ඔවුන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලය පිළිබඳ ක්‍රියාත්මක දැනුමක් ලබාගත යුතුය.

(ආ) ආධුනික/පරීක්ෂා සේවා කාලය අවසානයේ දී ඔවුන්ගේ පත්වීම් ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ තත්ත්වයට වඩා උසස් නොවන තත්ත්වයක් දක්වා යොමුවන නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණ, නියමිත කාල පරිච්ඡේදයක් තුළ දී සමත්වීම උඩ රඳා පවතිනු ඇත. නියමිත කාලපරිච්ඡේදයන් ඇතුළත මේ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීමට අපොහොසත් වුවහොත් ඒවා සමත්වන තෙක්, ලැබිය යුතු වැටුප් වැඩිවීම් නොගෙවා හැරීම එහි ප්‍රතිඵලය වන්නේ ය. ස්වකීය ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවසාන වන විට අවශ්‍ය සිංහල ප්‍රවීණතා තත්ත්වය ලබා නොගන්නා නිලධාරීන්ගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ ඇත්තේ ය.

සංලක්ෂ්‍යය.—රාජ්‍ය සේවයට බැඳීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබන අය, පත්වීම් ස්ථිර කිරීමේ පූර්ව නියමයක් වශයෙන් මේ සිංහල ප්‍රවීණතා පරීක්ෂණයන්ගෙන් සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

5. අවශ්‍ය සුදුසුකම්.—(i) තමා ලාංකිකයෙකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම ඉදිරිපත් කළ යුතුය. ලාංකික යනුවෙන් සඳහන් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

(ii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට උසස් විභාගයකින් සමත්ව සිටීම අවම අධ්‍යාපනික සුදුසුකම් ලෙස නියමකොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන්නකු සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලත් සිංහලයකු වෙතොත් ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් සිංහල භාෂාව විෂයයෙන් හෝ ඊට සමාන විෂයයකින් හෝ සමාර්ථය ලබා තිබිය යුතුය. (වර්ෂ 1961 ජනවාරි 1 වෙනිදාට පෙර සිට රාජ්‍ය සේවයේ යෙදී සිටියාවූ ද රාජ්‍ය සේවයේ වෙනත් තනතුරු ලබනු කැමැත්තා වූද නිලධාරීන් සම්බන්ධයෙන් මෙම නියමය අදාල නො වන්නේ ය.)

6. යුද්ධ සේවා අනුග්‍රහය.——මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙකම සුදුසුකම් ලැබ සිටින්නාවූ, මහා රාජිණියන් වහන්සේගේ යුද්ධ හමුදාවන්හි යෙදී සිටි සේවාමුක්ත වූද අයට සහාය හීනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාදී යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස්වූවන් හැර) සෑම කෙනෙකුටම්ද ඔවුනු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩවා සේවය කළෝ නම් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මේ ඇතුර තමන් සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩදෙනු ලැබේ.

7. වෙනත් අවශ්‍ය කරුණු.—(i) දැනට රජ්‍ය සේවයෙහි යෙදී සිටින සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. එසෙකුදු වුවත්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන විසින් ප්‍රසිද්ධ කරන ලද තනතුරක් පිළිබඳව ඉල්ලුම් කරන සෑම රජයේ සේවයේ නිලධාරියෙකු විසින් ම, තම ඉල්ලුම් පත්‍රය එසේ එව්වේ කවදාදැයි, ඒ සඳහා සපයා ඇති "ආ" සලකුණ දරණ මුද්‍රිත තැපැල් පතේ ලියා, ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට කලින් හෝ ලැබෙන ලෙස, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැන වෙත කෙළින් ම එවිය යුතුය. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසි යට අනුකූලව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම්ව සිටිත් ද, නැද් දැයි සඳහන් කොට එවිය යුතුය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක දන්වනු ලබන තැනට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමෙකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපෑවැත්මකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත් ඒ හේතු වෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණිනම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නිගමනයන්ට කවර ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යන්නෙහි විග්‍රහය.—සුදුසුකම් ලැබීම සඳහා වැටුප් යනුවෙන් අදහස් කරනුයේ මූලික ස්ථිර තනතුරේ වැටුප් පමණි. වැඩ බැලීම සඳහා ගෙවන වැටුප් දීමනා ආදිය කිසිවක් ඊට ඇතුළත් නොවේ.

---

අංකය : ඒබී.100/එක්.ස්.2195/69.

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### නාවින්නේ ආයුර්වේද පර්යේෂණායතනයේ පර්යේෂණ නිලධාරී (ආයුර්වේද සාහිත්‍යය) තනතුර

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නාවින්නේ, ආයුර්වේද පර්යේෂණායතනයේ පර්යේෂණ නිලධාරී (ආයුර්වේද සාහිත්‍යය) තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන් හී වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර, කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 පෙබරවාරි මස 27 වැනිද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර : 1970 මාර්තු මස 5 වැනිද.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද, නැද් ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9" × 4" ප්‍රමාණයට කුඩා නොවූ ද තම ලිපිනය ලියන ලද්දවූද මුද්දර නොගැසුවා වූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයන්හී සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත්කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන ලාංකික නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍යදැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින්ම ගෙවිය යුතුවෙයි.

2. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.—(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. රජයේ වැන්දඹු හා අනාත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට අවසර දෙනු නොලැබේ.

3. ඒකාබද්ධ වැටුප් ක්‍රමය.—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේ ය :

වර්ෂයකට රු. 6,720—360 × 12 හා 480 × 11—රු. 16,320 කි. වර්ෂයකට රු. 11,520 ට හා රු. 14,880 ට පෙර කාර්යක්ෂමතා කඩඉම් ඇත.

සටහන.—වර්ෂයකට රු. 11,520 ට පෙරවූ කාර්යක්ෂමතා කඩඉමෙන් ඔබ්බට උසස් කරනු ලබන්නේ පත්වීමට පසුව, කරණ ලද මූලික පර්යේෂණ කටයුතු අනුව වන අතර, රු. 14,880 ට පෙරවූ කාර්යක්ෂමතා ඔබ්බට උසස් කරනු ලබන්නේ වැඩ සහ හැසිරීම පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය අනුවය.

4. අවශ්‍ය සුදුසුකම්.—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1970 පෙබරවාරි මස 27 දිනට අවුරුදු 30 ට, නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි බව. (උපරිම වයස් සීමාව දෙපාර්තමේන්තු නිලධාරීන්ට බලපානු නොලැබේ.)

(ඇ) පිළිගත් ආයුර්වේද විද්‍යාලයක පළමුවැනි පන්තියේ ගෞරව ඩිප්ලෝමා සහතිකයක් ඇති බව.

(ඈ) ආයුර්වේදය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් හෝ ආයුර්වේදය පිළිබඳ මූලික පයෙශීෂණ හෝ නොයෙකුත් ප්‍රකාශණ පළ කිරීමෙන් ද, ලත් විශිෂ්ට කීර්තියක් ඇති බව.

(ඉ) පාලි දැනුමත් සමඟ සංස්කෘත පිළිබඳ I වෙනි හෝ දෙවෙනි පන්තියේ ගෞරව උපාධියක් හෝ උපාධි තත්ත්වයක සංස්කෘත හා පාලි දැනුමක්.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක් තැනගෙන් හෝ විද්‍යාලීය ආචාය‍ෂීවරයාගෙන් හෝ මහා චාය‍ෂීවරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල් වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීම්ට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එනෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදාදැයි ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර ෆෝර්මය සමඟ තමන්ට එවන ලද ("ආ" සලකුණ දරන) මුද්‍රිත තැපැල්පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නාමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රෙය් I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර ෆෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("අ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර ෆෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නා වූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නා වූද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටුකිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

ඩී. ආර්. එල්. බාලසූරිය,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 ජනවාරි මස 20 දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කායර්ාලයේ දී ය.
තැ. පෙ. 500.

1–518—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

අංකය : විආ/4/87.

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### 1971 ඕස්ට්‍රේලියානු පොදුරාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව

ඕස්ට්‍රේලියානු රජය විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ක්‍රමය යටතේ ඕස්ට්‍රේලියාවේ උසස් අධ්‍යාපනික ආයතනයන්හි 1971 මාර්තු මස ආරම්භ වන අධ්‍යයන වර්ෂයේ සිට පශ්චාත් උපාධි අධ්‍යාපනය සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

අයදුම් කළ හැකි අධ්‍යයන ක්ෂේත්‍රයයන් පිළිබඳ සීමාවක් පනවනු නොලැබේ. එහෙත්, කොළඹ ක්‍රමය යටතේ සාමාන්‍යයෙන් අනුමත නොකැරෙන පාඨමාලා සඳහා අයදුම් කරන අපේක්ෂකයන් කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ

**සංලක්‍ෂය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම් පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තම්නේතු ප්‍රධානියා විසින් අංක 514 හා 1960. 5. 16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම් පත් සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්‍ෂය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම් පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්‍ෂය 3 :** එක් අයදුම් කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් අධ්‍යයන වර්ෂ දෙකක් වන්නේ ය. එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ඕස්ට්‍රේලියානු බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1971. 3. 1 වැනි දිනට, වයස අවුරුදු 28ට අඩු විය යුතුයි.

(iii) යටත් පිරිසෙයින් හැදෑරීමට අදහස් කරන පශ්චාත් උපාධි පාඨමාලාවට උචිත විෂයයන් සහිතව (පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත්) දෙවැනි පෙළ උපාධියක් තිබිය යුතුයි. (ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම්පත් භාරගනු නොලැබේ.)

(iv) ඉංග්‍රීසි භාෂාවෙහි උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

**සංලක්‍ෂය 1 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1971. 3. 1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්‍ෂය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම් පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) ඕස්ට්‍රේලියාව බලා යෑම හා ආපසු පැමිණීම සඳහා ඉතා කෙටි සංචාරක පන්තියේ ගුවන් ගමන් පහසුකම් ;

(ආ) සියලුම අනිවාර්ය ගාස්තු ;

(ඉ) ඕස්ට්‍රේලියාවට ලඟා වූ දින සිට (දෙසතියකට වරක් බැගින් කොටස් වශයෙන් ගෙවනු ලබන) වර්ෂයකට ඕස්ට්‍රේලියානු ඩොලර් 2,000 ක යැපීම් දීමනාවක් ;

(ඊ) අනුමත කළ අවස්ථාවන් හි, ඕස්ට්‍රේලියානු ඩොලර් 100ක උපරිමයකට යටත් ඇඳුම් දීමනාවක් ;

(උ) භාර්යාවන් කැටුව එන විවාහක පිරිමි ශිෂ්‍යත්වධාරීන්ට, අනුමත කළ අවස්ථාවන් හි, වර්ෂයකට ඕස්ට්‍රේලියානු ඩොලර් 540ක විවාහක දීමනාවක්—භාර්යාව ශිෂ්‍යත්වයක් දරන්නේ නම් හෝ වැටුප් ලබන රැකියාවක යෙදී සිටින්නී නම් හෝ දීමනාව ගෙවනු නොලැබේ. (මේ දීමනාව අදහස් කර ඇත්තේ, ශිෂ්‍යත්වධාරියාගේ භාර්යාව ඕස්ට්‍රේලියාවේ නඩත්තු කිරීම සඳහා ආධාර මුදලක් වශයෙන් පමණය. භාර්යාව කැටුව එන ශිෂ්‍යත්වධාරීන්ට වෙනත් ආදායම් මාර්ග තිබිය යුතුය.

(ඌ) නිවාඩු කාලය තුල ඕස්ට්‍රේලියාව ඇතුලත ගමන් සඳහා ඕස්ට්‍රේලියානු ඩොලර් 100ක උපරිමයට යටත් දීමනාවක් ;

(ඔ) අවශ්‍ය පොත් හා උපකරණවල මිල අස්වාභාවික ලෙස වැඩි වුවහොත් හා විශේෂ වෛද්‍ය වියදම් සහ අවශ්‍ය වුවහොත් අමතර දීමනා ගෙවනු ලැබේ. (මේ දීමනා සඳහා ඕස්ට්‍රේලියාවේදී බදු අයකරනු නොලැබේ.)

**සංලක්‍ෂය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩුදීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්‍ෂණය.**—සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්‍ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්‍ෂකයන් ඕස්ට්‍රේලියාව බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්‍ෂණය.**—තෝරාගනු ලබන අපේක්‍ෂකයන් ඕස්ට්‍රේලියාවේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරදි ප්‍රකාශයක් කර ඇති බව තෝරාගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්‍ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්‍ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපෙක්‍ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතුය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපෙක්‍ෂයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපෑවැත් වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපෙක්‍ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්‍ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1970. 2. 12 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කල යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ,
ස්ථිර ලේකම්.

1970 ජනවාරි මස 20 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

1-498/1—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

අංකය : විඅා/4/82

**අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය**

**1971 නවසීලන්ත පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව**

නවසීලන්ත රජය විසින් පොදු රාජ්‍ය මණ්ඩලීය ශිෂ්‍යත්ව හා අධිශිෂ්‍යත්ව ක්‍රමය යටතේ නවසීලන්තයේ උසස් අධ්‍යාපනික ආයතනයන් හි 1971 මාර්තු මස ආරම්භ වන අධ්‍යයන වර්ෂයේ සිට පශ්චාත් උපාධි අධ්‍යාපනය හෝ පර්යේෂණය සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් භාරගනු ලබන්නේ පහත සඳහන් අධ්‍යයන ක්ෂේත්‍රයයන් සඳහා පමණකි :—

කෘෂිකර්ම විද්‍යාව
උද්‍යාන විද්‍යාව
උද්භිද විද්‍යාව
සත්ව විද්‍යාව
ක්‍ෂුද්‍ර ජීව විද්‍යාව
රසායන විද්‍යාව
භෞතික විද්‍යාව
ගණිතය
ඉංජිනේරු විද්‍යාව
ආකර ශිල්පය හා ලෝහ විද්‍යාව
භූගර්භ විද්‍යාව
භූගෝල විද්‍යාව
අර්ථ ශාස්ත්‍රය
ඉංග්‍රීසි
ඉතිහාසය

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්‍ෂය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම්කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්ත

මේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960.5.16 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්ෂය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම්පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතු ය.

**සංලක්ෂය 3 :** එක් අයදුම්කරුවකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය :** ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් අධ්‍යයන වර්ෂ දෙකක් හා අතරතුර ග්‍රීෂ්ම ඍතුව සඳහා වේ.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ නවසීලන්ත බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේ වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම් :** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) 1971.3.1 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩු විය යුතුයි.

(iii) යටත් පිරිසෙයින් හැදෑරීමට අදහස් කරන පශ්චාත් උපාධි පාඨමාලාවට උචිත විෂයයන් සහිතව (පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත්) දෙවැනි පෙළ උපාධියක් තිබිය යුතුයි. (ප්‍රතිඵල අපේක්ෂාවෙන් අයදුම්පත් භාරගනු නොලැබේ.)

(iv) ඉංග්‍රීසි භාෂාවෙහි උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුය.

**සංලක්ෂය 1 :** රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1971.3.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන්ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමැති නම්, ඒ බව අයදුම්පතේ 15 (ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන් :** ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) නවසීලන්තය බලා යාම සහ ආපසු ඒම සඳහා නවසීලන්ත අධිකාරීන් විසින් පිළියෙල කරන පරිදි සංචාරක පන්තියේ මුහුදු හෝ ගුවන් ගමන් පහසුකම් (පවුලේ අය සඳහා ගමන් වියදම් ගෙවනු නොලැබේ).

(ආ) අනුමත කළ ඉගැන්වීමේ ගාස්තු, රසායනාගාර ගාස්තු හා විභාග ගාස්තු,

(ඉ) නවසීලන්තයට ලඟා වූ දින සිට මසකට නවසීලන්ත ඩොලර් 117 බැගින් පෞද්ගලික යැපීම් දීමනාවක්,

(ඊ) පොත් හා උපකරණ සඳහා වර්ෂයකට නවසීලන්ත ඩොලර් 50 ක දීමනාවක්,

(උ) අධ්‍යයන වැඩ සටහන සම්බන්ධයෙන්, නවසීලන්තය ඇතුළත ගමන් සඳහා නවසීලන්ත ඩොලර් 50 ක දීමනාවක්,

(ඌ) යෝග්‍ය අවස්ථාවන් හිදී, නවසීලන්ත ඩොලර් 80 ක ඇඳුම් දීමනාවක්, මෙය මූලික වශයෙන් බලපවත්වන්නේ සම කලාපීය රටවල ශිෂ්‍යත්වධාරීන්ටය,

(එ) ශ්‍රව්‍ය ආධාර, ඇස් කණ්ණාඩි හා දන්ත ප්‍රතිකාර හැර වෙනත් වෛද්‍ය හා ආරෝග්‍යශාලා වියදම්,

(ඒ) විවාහක පිරිමි ශිෂ්‍යත්වධාරීන් සඳහා වර්ෂයකට නවසීලන්ත ඩොලර් 408 ක විවාහක දීමනාවක්. භාර්යාව ශිෂ්‍යත්වයක් දරන්නී නම් හෝ වැටුප් ලබන රැකියාවක යෙදී සිටින්නී නම් හෝ මේ දීමනාව ගෙවනු නොලැබේ. (මේ දීමනා සඳහා නවසීලන්තයේදී බදු අය කරනු නොලැබේ).

**සංලක්ෂය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය :** සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ගිවිසුම :** තෝරාගනු ලබන අපෙක්ෂකයන් නවසීලන්තය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය :** තෝරාගනු ලබන අපෙක්ෂකයන් නවසීලන්තයේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මඟින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරැදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරාගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපෙක්ෂකයෙකු තෝරාගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡෙදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපෙක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපෙක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපෙක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම්පත්, 1970.2.12 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන්කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම්පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම්පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මඟින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම්පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම්පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම්පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේ ය.

**ස්ථිර ලේකම්,**
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය.

1970 ජනවාරි මස 20 වැනිදා,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

1–498/2—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

### කනිෂ්ඨ විශ්ව විද්‍යාලයයන්හි ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක/උපදේශිකා තනතුරු

කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ (ශු. අ. හා ක. වි. වි. ශාඛාවේ) ස්ථිර ලේකම් විසින් කණිෂ්ඨ විශ්ව විද්‍යාලයයන්හි ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක/උපදේශිකා තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයේම අපේක්ෂකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් 1970 පෙබරවාරි මස 15 වැනි දිනට හෝ ඉන් පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුයි.

2. **වැටුප් දීමනා හා සේවා කොන්දේසි.**—

(1) මෙම තනතුරු සඳහා නියමිත ඒකාබද්ධ වාර්ෂික වැටුප් ක්‍රමය රු. 6,024—144 × 4—180 × 8—රු. 8,040 (**සටහන,**—1969.10.1 වැනි දිනට ප්‍රථම මීට අනුරූප වැටුප් ක්‍රමය රු. 3,420—120 × 4—180 × 8—රු. 5,340 වේ.).

(2) තෝරාගනු ලබන අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම කණිෂ්ඨ විශ්ව විද්‍යාලයක සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුයි. දැනට පොල්ගොල්ල, කුලියාපිටිය, ගාල්ල, දෙහිවල, කැගල්ල සහ පලාලි කණිෂ්ඨ විශ්ව විද්‍යාලවල පුරප්පාඩු තිබේ. තෝරාගනු ලබන අපේක්ෂකයින් මෙම විදුහල්වලින් එකකට පත් කර යැවීමට ඉඩ තිබේ.

3. **බඳවා ගැනීමේ කොන්දේසි.**—

(1) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.

(2) මෙම පත්වීම් ප්‍රථම කොට අවුරුදු (3) තුනක ආධුනික කාලයකට යටත් වනු ඇත.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින්ම ඔහු/ඈ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(අ) 1970 පෙබරවාරි 15 වැනි දිනට වයස විසි හතරට (24) නොඅඩු බවට හා අවුරුදු හතළිස් පහට (45) නොවැඩි බවට, (දැනටමත් රජයේ සේවයේ ස්ථිර තනතුරු දරණ අයට උපරිම වයස් සීමාව බල නොපානවා ඇත.)

(ආ) (I) ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පිළිගත් විද්‍යාලයක හෝ ආයතනයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳ එක් වර්ෂයක නේවාසික/පූර්ණකාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් පසු ශාරීරික අධ්‍යාපන පරීක්ෂක/පරීක්ෂිකාවක් වශයෙන් යටත් පිරිසෙයින් හත් වර්ෂයක (7) සතුටුදායක සේවා කාලයක් තිබීම, හෝ ;

(II) (i) පිළිගත් විශ්ව විද්‍යාලයක, ශාරීරික අධ්‍යාපන විද්‍යාලයක හෝ ආයතනයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳ යටත් පිරිසෙයින් එක් අවුරුදු පශ්චාත් උපාධි නේවාසික/පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් පසුව ලබා ගත් ඩිප්ලෝමා සහතික පත්‍රයක්, හෝ ;
පිළිගත් ශාරීරික අධ්‍යාපන විද්‍යාලයක හෝ ආයතනයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුදු දෙකක නේවාසික/පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරීමෙන් පසුව ලබා ගත් ඩිප්ලෝමා සහතික පත්‍රයක්, හෝ ;

පිළිගත් ශාරීරික අධ්‍යාපන විද්‍යාලයකින් හෝ ආයතනයකින් ශාරීරික අධ්‍යාපන පිළිබඳ ලබා ගත් ගුරු සහතික පත්‍රයක් සහ ඊට පසුව එබඳු විද්‍යාලයක හෝ ආයතනයක හෝ පිළිගත් විශ්ව විද්‍යාලයක ශාරීරික අධ්‍යාපනය පිළිබඳ එක් අවුරුදු නේවාසික/පූර්ණ කාලීන පුහුණුවීමේ පාඨමාලාවක් හදරා තිබීම, හෝ ;

ද්විතීයික පුහුණු ගුරු සහතික පත්‍රයක් සහ පිළිගත් ශාරීරික අධ්‍යාපන විද්‍යාලයකින් හෝ ආයතනයකින් ලබා ගත් ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ගුරු සහතික පත්‍රයක්, හා ;

(ii) ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පරිපාලන වැඩ හෝ, ශාරීරික අධ්‍යාපනය ඉගැන්වීමේ හෝ අවුරුදු පහක (5) පළපුරුද්ද ;

(iii) ඉහත සඳහන් කිනම් අයුරු ඡේදයක වුවද සඳහන් සුදුසුකම් වලට සමාන හෝ උසස් සුදුසුකම් තිබීම ;

(iv) සිංහල/දෙමළ භාෂාවෙන් වැඩ කිරීමේ මනා දැනුමක් තිබීම, නමුත් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඕනෑම කෙනෙකුට යම්කිසි කාලයක් ඇතුළත දී නියම කරනු ලබන මට්ටමකින් සිංහල පිළිබඳ ප්‍රවීණතාවයක් ලබා ගැනීමට නියම කළ හැක.

(v) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සනීපයෙන් යුක්තවීම.

5. මෙහි පහත සඳහන් කරනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම් පත්‍ර නියමිත පෝරමයේ ඉල්ලුම් කළ යුතුය. මෙම කාර්යාලය මගින් ඉල්ලුම් පත්‍ර පෝරම සපයනු නොලැබේ. නමුත් දැන්වීමේ සඳහන් කර ඇති ආදර්ශ ඉල්ලුම් පත්‍රය අයදුම්කරුවන් විසින් පිටපත් කර ගත යුතුයි.

6. මෙම ගැසට් පත්‍රයේ පළවෙනි කොටසේ (II) ඡේදයේ ආරම්භයේ පළ කර ඇති රජයේ සේවයේ තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් යෙදෙන සාමාන්‍ය කොන්දේසි ද බලනු මැනවි.

අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

ශුවි/4/21/16,
1970 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දී ය.

## ආදර්ශ පෝරමය

### කණිෂ්ඨ විශ්ව විද්‍යාලයයන්හි ශාරීරික අධ්‍යාපනය පිළිබඳ උපදේශක/උපදේශිකා තනතුරු ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. මුලකුරු සමග නම :————.

3. ලිපිනය :—
   (1) පෞද්ගලික :————.
   (2) රාජකාරි :————.

4. 1970 පෙබරවාරි 15 වැනි දිනට නිවැරදි වයස : අවුරුදු :————, මාස :————, දින :————.

5. ජාතිය හා එය ලත් අන්දම :————.

6. උපන් ස්ථානය :—
   (අ) ඉල්ලුම්කරු :————.
   (ආ) ඔහුගේ/ඇගේ පියා :————.
   (ඇ) ඔහුගේ/ඇගේ පියාගේ පියා :————.
   (ඈ) ඔහුගේ/ඇගේ පියාගේත් පියාගේ පියා :————.

7. ලබා ගත් දිනත් සමග අධ්‍යාපන සුදුසුකම් (ලබා තිබෙන උසස්ම අධ්‍යයන සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.) :————.

8. වෘත්තීය සුදුසුකම් :————.

9. ඉගෙනීම ලැබූ පාඨශාලා හා විද්‍යාල. (ඇතුළත් වූ දින හා අස් වූ දින සඳහන් කරන්න.) :————.

10. ඉගැන්වීමේ පළපුරුද්ද/ශාරීරික අධ්‍යාපනය පිළිබඳ පරිපාලන වැඩ. (මෙහි පහත දක්වෙන ෆෝර්මයෙහි විස්තර සඳහන් කරන්න.)

| පාසැලේ හෝ විද්‍යාලයේ හෝ දෙපාර්තමේන්තුවේ නම | ඇතුළත් වූ දිනය | අස් වූ දිනය | දරූ තනතුර | සේවා කාලය | අස්වීමට හේතු |
|---|---|---|---|---|---|
| | | | | අවු. මා. දින | |
| | | | | මුළු ගණන | |

11. සිංහල/දෙමළ පිළිබඳ ලබා ඇති සුදුසුකම් :————.

12. චරිත සහතික ලබා ගත් අයගේ (ඥතීන් නොවේ) නම් හා නිල නාමයන් :————.

13. වෙනත් සුදුසුකම් :————.

ම විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙම ඉල්ලුම් පත්‍රයේ යම්කිසි අසත්‍ය හෝ වැරදි තොරතුරක් සඳහන් කර තිබෙන බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් මා නුසුදුසු බවට පැමිණෙනවා පමණක් නොව තෝරා පත් කිරීමෙන් පසු ඒ බව දැන ගන්නට ලැබුන හොත් කිසිම වන්දි ගෙවීමක් නොමැතිව මා රාජකාරියෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–781—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය

### ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන පුස්තකාලය සේවා පුහුණුව

අධ්‍යාපන අමාත්‍යාංශයේ ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන පුස්තකාලය සේවා අංශය සංවිධානය කරන මේ දෙසති පුහුණුව සඳහා සුදුසු ගුරුවරුන්, ගුරුවරියන් තෝරා ගැනීමට මෙහි දක්වෙන ආකෘති පත්‍රය අනුව පිළිවෙළ කැරෙන ඉල්ලීම් පත්, 1970. 2. 20 දින දක්වා භාර ගනු ලැබේ. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ උඩ වම් කෙළවරෙහි " ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන පුස්තකාලය සේවා පුහුණුව " යනුවෙන් සඳහන් කර, කොළඹ 2, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන හා පුස්තකාල සේවා අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත එවිය යුතුය.

2. මේ පාඨමාලාව සිංහල, දෙමළ මාධ්‍ය දෙකින් ම පැවැත් වේ.

3. ඉල්ලුම්කරුවන් ගුරු විද්‍යාලක පුහුණුවකින් පසු ස්ථිර සේවා යෙහි යෙදී සිටින්නන් විය යුතුය.

4. 1970 පෙබරවාරි 1 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

5. තෝරාගනු ලබන අයට කොළඹ, අධ්‍යාපන අමාත්‍යාංශයේ දෙසති යක් තුළ පැවැත්වෙන පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා නිල නිවාඩු, යැපීම් දීමනා, පාඨමාලාව ආරම්භයේ පැමිණීමටත් අවසානයේ ආපසු යාමටත් රාජකාරි දුම්රිය බලපත්‍ර ලැබේ.

6. පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කළ විට සහතිකයක් පිරි නැමේ.

7. ආපසු සේවයට යැවෙන විද්‍යාලයේ ඉගැනුම් උදවු මධ්‍යස්ථානයේ (විද්‍යාල පොත් ගුලේ සහ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ) කටයුතු පැවරෙනු ඇත.

8. විද්‍යාලයේ දී ඒ කටයුතු වල යෙදෙන පැ ගණන ඉගැන්වීමේ යෙදී සිටි ලෙස සලකනු ලැබේ.

ඞී. ජී. දයාරත්න,
ස්ථිර ලේකම් සහ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1970 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ දීය.

### ශ්‍රව්‍ය දෘශ්‍ය අධ්‍යාපන පුස්තකාල සේවා ගුරු පුහුණුව (ඉල්ලුම් පත්‍රය)

1. සම්පූර්ණ නම :————.
(මෙනෙවිය/මහත්මිය/මහත්මයා)

2. උපන් දිනය සහ 1970. 2. 1 දිනට වයස :————.
අවු :——, මාස :——.

3. පදවිය සහ ගුරුවරයකු වශයෙන් ලියා පදිංචි අංකය :————.

4. විද්‍යාලයේ ලිපිනය :————.

5. ගෙදර ලිපිනය :————.

6. ගම් ප්‍රදේශය :————.

7. ගැහැණු/පිරිමි බව :————.

8. විවාහක/අවිවාහක බව :————.
විවාහක නම් හිමියා/බිරිය රැකියාවක් කරයිද ? :————.
ඔහුගේ/ඇගේ රැකියාවේ තොරතුරු :————.

9. වෘත්තීය සුදුසුකම් :—
පුහුණු වූ ගුරු විද්‍යාලය :————.
කාල සීමාව :————.
සහතිකයේ අංකය, වලංගු දිනය :————.
එහි සඳහන් විෂයයන් :————.

10. වෙනත් සහතික :————.

11. භාෂා දැනුම :—
සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

සමත් වී ඇති උසස් ම විභාගය :—
සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

12. පොත්ගුල් සංවිධානය පිළිබඳ ලබා ඇති සුදුසුකම් සහ පළ පුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

13. ඉගැනුම් උදවු, තැනීම සහ භාවිතය පිළිබඳ ලබා ඇති විශේෂ සුදුසුකම් සහ පළපුරුද්ද :————.
(ප්‍රොජැක්ටර්, ටේප් රැකෝඩර්, ආදී උපකරණ භාවිතය ගැන පුහුණුවක් ඇත්නම් සඳහන් කරන්න.)

14. විශේෂ ලැදිකම් :————.

15. විශේෂ දක්ෂකම් :————.

16. වෙන වෘත්තියක යෙදී සිටියේ නම් ඒ තොරතුරු :————.

17. පුස්තකාලයක සාමාජිකත්වය දරන්නේ නම් ඒ විස්තර : ————.

18. අදාළ වෙනත් තොරතුරු :————.

19. සැබෑ නිවැරදි තොරතුරු ම විසින් මෙහි සැපයූ බව පවසමි. ————.

අත්සන :————.
දිනය :————.

20. විද්‍යාලපති අනුමතිය :—
.......................................විද්‍යාලයේ සේවය කරන
................................ මෙනෙවිය/මහත්මිය/මහත්මා

මේ පුහුණුව සඳහා ඉතා සුදුසු/සුදුසු/නුසුදුසු බව සහතික කරමි. දෙසතියක පුහුණුව සඳහා මේ ගුරුවරයා/ගුරුවරිය නිදහස් කළ හැකිය/නොහැකිය.

————,
විද්‍යාලපති.

දිනය :————.

1–682—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## ලංකා යුධ හමුදාව—සෙසු නිළ පත්වීම්

1969 දෙසැම්බර් මස 12 වෙනි දින අංක 14,884 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ලංකා යුද හමුදාවේ සෙසුනිල ඇබෑර්තු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1970 පෙබරවාරි මස 14 වෙනි දින දක්වා දීර්ඝ කර ඇත.

1–683—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### දෙවන පන්තියේ ජංගම දොඹකර ක්‍රියාකරවන්නන්ගේ තනතුරු—යාන්ත්‍රික ඉංජිනේරු අංශය

කොළඹ වරාය කොමිෂන් සභාවේ යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ පුරප්පාඩුව් තිබෙන ඉහත සඳහන් තනතුරු උදෙසා අයදුම් පත් කැඳවනු ලැබේ. මේ සඳහා අයදුම්පත් පහත සඳහන්වන ආකෘති පත්‍රය අනුව පිළියෙල කර, වරාය කොමසාරිස්, ඉංජිනේරු අංශය, වරාය කොමිෂන් සභාව, කොළඹ 1 යනුවෙන් අමතා 1970. 2. 27 වැනි දින පෙරවරු 12ට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන ලෙස එවිය යුතුය.

**2. වැටුප් ක්‍රමය.**—පළමු හය මස තුළ දිනකට රු. 8ක ඒකාබද්ධ දෛනික වැටුපක් සහ ඊට පසු වසකට රු. 2,640—60 × 15—රු. 3,540ක ඒකාබද්ධ වැටුපක් ගෙවනු ලැබේ. තනතුරු ස්ථිරය. එහෙත් විශ්‍රාම වැටුපක් රහිතය.

3. තෝරාගනු ලබන අපේක්ෂකයින් සම්සක සේවා කාලයකින් පසුව මාසික වැටුප් ක්‍රමයට මාරු කරනු ලැබේ. එවිට රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලේ දායකත්වය හිමිවේ.

4. **සුදුසුකම් :**

(i) වයස අවුරුදු 21ට වැඩිවිය යුතුයි.

(ii) පිළිගත් ආයතනයක දොඹකර රියැදුරෙකු වශයෙන් අඩු වශයෙන් අවුරුදු 5 ක් වත් සේවයක් ඇති බවට සහතික ඉදිරිපත් කළ යුතුයි.

(iii) බර ප්‍රමාණයන් තක්සේරු කිරීම පිළිබඳව දනා දැනීමක් තිබිය යුතුයි.

(iv) ඇන්ජිම පරීක්ෂා කරමින් එය ස්ටාර්ට් කිරීමට සහ නැවැත් වීමට හැකිවිය යුතුයි.

(v) දොඹකර කඩිනමින් ක්‍රියා කරවන අතරම එය කරකැවීමට සහ එසවීමට හැකිවිය යුතුයි.

(vi) දොඹකරයේ ඇතිවන සුළු වැරදි ගැන දැනීමක් තිබිය යුතුයි.

5. සෑම අයදුම්කරුවෙක්ම තම ඉල්ලුම්පත්‍රයට, පහත දැක්වෙන සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.

(i) උප්පැන්න සහතිකය.

(ii) ළඟදී ලබාගත් චරිත සහතිකයක්.

(iii) 4 වැනි ඡේදයේ (ii) සිට (vi) දක්වා විස්තර කරන ලද පළපුරුදුකම් පිළිබඳ සහතික.

6. අවශ්‍ය වුවහොත් කෙටි දැන්වීමකින්, පිට පළාත්වල වැඩට යාමට සාමාන්‍යයෙන් වැඩ කරන වේලාවෙන් පිටස්තරව වැඩ කිරීමට සහ මුරෙන් මුර වැඩ කිරීමට සූදානම්ව සිටිය යුතුයි.

7. ඉල්ලුම්පත්‍රයේ මෙම තනතුරු සම්බන්ධයෙන් එවන සෑම ලිපියක්ම, කරන සෑම විමසීමක්ම ඉදිරිපත් කළ යුත්තේ "වරාය කොමසාරිස්, ඉංජිනේරු අංශය" කියා මිස, මෙම දෙපාර්තමේන්තුවේ වෙනත් නිලධාරියකුගේ පෞද්ගලික නමට නොවන බව සැලකිය යුතුයි.

8. මේ සම්බන්ධයෙන් ඉල්ලුම්කරුවන්ට ගමන් ගාස්තු හෝ වෙනත් ගෙවීම් කිසිවක් නොගෙවන අතර, ඉල්ලුම්පත්‍ර ලැබුණු බව ද දන්වනු නොලැබේ.

9. මෙම අවශ්‍යතාවයනට අදාල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10. රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ප්‍රසිද්ධ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසි ඉල්ලුම්කරුවන්ගේ සැලකිල්ලට යොමුවිය යුතුය.

එල්. එස්. ද සිල්වා,
වරාය කොමසාරිස් වෙනුවට.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1970. 1. 16 දින.

### ආකෘති පත්‍රය

**දෙවන පන්තියේ ජංගම දොඹකර ක්‍රියා කරවන්නන්ගේ තනතුරු—ඉංජිනේරු අංශය, වරාය කොමිෂන් සභාව**

1. සම්පූර්ණ නම :————.
2. පෞද්ගලික ලිපිනය :————.
3. වයස සහ උපන් දිනය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.) :————.
4. පළපුරුදුකම් පිළිබඳ විස්තර (සහතික පිටපත් ඇමිණිය යුතුයි) : ————.
5. වෙනත් සුදුසුකම් පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–684—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන අමාත්‍යාංශය

### ජලසම්පාදන, ජලපවාහන හා පළාත් පාලන වැඩ අංශය

### ගල්රෝල් රියැදුරු තනතුරු

පළාත් පාලන අමාත්‍යාංශයේ ජ.ස.ජ. හා ප.පා.වැ. අංශයේ කම්කරු ශ්‍රෙණියේ I වැනි සහ II වැනි පංතිවල තාවකාලික ගල්රෝල් රියැදුරු තනතුරු සඳහා පහත දක්වා ඇති පරිදි සුදුසුකම් ඇති ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. ඉල්ලුම් පත්, මෙම දන්වීම කෙළවර ඇති ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කර 1970.2.18 දිනට හෝ ඊට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ, ජලසම්පාදන, ජලපවාහන හා පළාත් පාලන වැඩ අධ්‍යක්ෂ, පළාත් පාලන අමාත්‍යාංශය, රත්මලාන යන ලිපිනයට ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

**I වන පංතියේ තාවකාලික ගල්රෝල් රියැදුරු තනතුර :**

**(1) වැටුප් ක්‍රමය.—(අ) කොළඹ නාගරික සීමාව සහ නාගරික සීමාවේ සිට සැතපුම් 5 ක අරය තුළවූ ප්‍රදේශය තුළ හෝ ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතනයක් හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබ ඇති ආයතනවල හෝ සේවය කරන්නවුන් සඳහා :—**

පළමු හය මස තුළ දිනකට රු. 10.70 බැගින් සහ ඊට පසු වර්ෂයකට රුපියල් 3,240—60 × 12—3,960/—

**(ආ) පිට පළාත්වල ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතන හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු නොලැබ ඇති ආයතනවල සේවය කරන්නවුන් සඳහා :—**

පළමු හය මස තුළ දිනකට රු. 9.70 බැගින් සහ ඊට පසු වර්ෂයකට රුපියල් 3,060—60 × 8—රු. 3,600/—

**(II) වයස් සීමාව.**—ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 25ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුයි. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**(III) අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—(අ) ගල්රෝල පිළිබඳව II පංතියෙහි, ඒවා ක්‍රියා කරවීම හා/හෝ අළුත්වැඩියා කිරීම පිළිබඳව අවුරුදු 5ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය.

(ආ) පාරවල් සෑදීම, අළුත්වැඩියා කිරීම හා රෝල් කිරීම පිළිබඳව දැනීමක් තිබිය යුතුය.

(ඇ) ප්‍රිමික්ස් අතුරනු රෝල් කිරීම පිළිබඳව පළපුරුද්දක් ලබා තිබීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්විය යුතුයි.

**පරීක්ෂණය.**—ඕනෑම තත්ත්වයක් යටතෙහි, ඕනෑම වර්ගයක රෝලක් නිසියාකාර ක්‍රියා කරවීමට ඔහුට තිබෙන හැකියාව නිශ්චය කිරීමට.

මේ අනුව ඉල්ලුම්කරුවන් පරීක්ෂා කෙරෙනු ඇත.

(ඈ) පිළිගත් ආයතනයක පළවෙනි පංතියේ අදළ වෘත්තීයකරුවකු වශයෙන් අවුරුදු 6 කට නොඅඩු සේවයක් තිබීම. (සහතික පත් මඟින් සනාථ කළ යුතුයි) සහ

(ඉ) මනා චරිතයකින් යුක්තවීම (වගකිව යුතු පුද්ගලයින් අත්සන් කළ චරිත සහතික 2ක් ඉදිරිපත් කළ යුතුයි).

**සටහන.**—එක්සත් රාජධානි කඳවුරුවල වෘත්තිකයෙකු ලෙස කළ සේවය පිළිගත් ආයතනයක සේවය වශයෙන් පිළිගනු ලැබේ.

**II පංතියේ තාවකාලික ගල්රෝල් රියැදුරු තනතුරු :**

**(1) වැටුප් පරිමාණය.**—(අ) කොළඹ නාගරික සීමාව සහ නාගරික සීමාවේ සිට සැතපුම් 5 ක අරය තුළවූ ප්‍රදේශය තුළ හෝ ඉංජිනේරු හා

කර්මාන්තශාලීය ආයතනයක් හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබ ඇති ආයතනවල හෝ සේවය කරන්නවුන් සඳහා—

පළමු හය මස තුළ දිනකට රු. 8.00 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 2,640—60—රු. 3,540

(ආ) පිට පළාත්වල ඉංජිනේරු හා කර්මාන්තශාලීය ආයතන හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු නොලැබ ඇති ආයතනවල සේවය කරන්නවුන් සඳහා—

පළමු හය මස තුළ දිනකට රු. 7.60 බැගින් සහ ඊට පසු වර්ෂයකට රු. 2,640—60—රු. 3,240

(II) **වයස් සීමාව.**—ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට යටත් පිරිසෙයින් අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 30 කට නොවැඩි විය යුතුයි. දනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නවුන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

(III) **අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම්.**—(අ) (III) වන පංතියේ ගල්රෝල් එලවන්නෙකු වශයෙන් යටත් පිරිසෙයින් අවුරුදු 2ක පළ පුරුද්දක් ලබා තිබිය යුතුයි.

(ආ) එන්ජිමේ ක්‍රියා කාරිත්වය පිළිබඳව හා ක්ලච්වය හෝ රිවර්ස් ගියරය හා සම්ප්‍රේෂණය ආදිය පිළිබඳව මූලික දැනීමක් තිබිය යුතුය.

(ඇ) එන්ජිමෙහි, ක්ලච්වයෙහි හෝ රිවර්ස් ගියරයෙහි සම්ප්‍රේෂණ ගියරය ආදියෙහි නිතර ඇතිවන දෝෂ සොයා ගැනීමට පිළිවන් විය යුතුයි.

(ඈ) රෝල තබා ගැනීම පිළිබඳව මනා දැනීමක් තිබිය යුතුයි.

(ඉ) (වාෂ්ප රෝලවල) බොයිලේරුව හා එහි සවිකර තිබෙන දේවල් ආරක්ෂා කිරීම හා තබා ගැනීම පිළිබඳව දැනීමක් තිබිය යුතුයි.

(ඊ) පාරවල්වල වැඩ හා රෝල් කිරීම පිළිබඳව ඔහුගේ හැකියාව නිශ්චය කිරීමට සෑහෙන දැනුමක් සහ ස්ටාට් කිරීමට පළමු එන්ජිම හා රෝල සෝදිසි කිරීමට හා එන්ජිම ස්ටාට් කිරීමට හා නැවැත්වීමට දැනීමක් තිබිය යුතුයි.

**පරීක්ෂණය.**—රෝල නිසියාකාර ක්‍රියා කරවීමට ඔහුට තිබෙන හැකියාව නිශ්චය කිරීමට එනම් සියලුම තත්ත්වයන් යටතෙහි එළවීමේ පරීක්ෂණයක් අනුව ඉල්ලුම් කරුවන් විභාග කෙරේ.

(උ) පිළිගත් ආයතනයක 11 පංතියේ අදාළ තනතුරක අවුරුදු 5 ක නොඅඩු පළපුරුද්දක් තිබීම. (සහතික පත් මගින් සනාථ කළ යුතුයි.) සහ,

(ඌ) මනා චරිතයකින් යුක්ත වීම. (වගකිවයුතු පුද්ගලයින් අත්සන් කළ චරිත සහතික 2ක් ඉදිරිපත් කළ යුතුයි.)

**සටහන.**—එක්සත් රාජධානි කඳවුරුවල වෘත්තිකයෙකු ලෙස කළ සේවය පිළිගත් ආයතනයක සේවය වශයෙන් පිළිගනු ලැබේ.

2. **සේවයේ යෙදවීමේ වගන්ති.**—තනතුර තාවකාලික වන අතර, ස්ථිරත්වය සඳහා ඉල්ලුම් කළ නොහැක. මාසික වැටුප් ක්‍රමයෙහි තැබීමෙන් පසු විශ්‍රාම වැටුප් හිමි තත්ත්වය ලැබෙන තුරු රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුයි.

3. **කොන්දේසි.**—(අ) පත්කරනු ලබන්නා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම් ;

(ආ) ඔහු රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතේ විධි විධානයන් ක්‍රියාවට නැංවීම පිණිසද සම්පාදිතව පවත්නා හෝ මින් මතුවට සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

(ඇ) පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි යන මේවාට සහ කලින් කල රජය විසින් නිකුත් කරන වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් වනු ඇත.

(ඈ) නියම කෙරෙන දිවයිනේ කවර ප්‍රදේශයක වුවද පත්කරනු ලබන්නා සේවය කළ යුතුය.

ආර්. වී. පෙරුමයිනාර්,
වැඩ බලන අධ්‍යක්ෂ.

**ආදර්ශ ඉල්ලුම් පත්‍රය**

........වැනි පන්තියේ ගල්රෝල් රියැදුරු තනතුර

1. නම (මුලකුර සමඟ) :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය :————. 1969........දිනට වයස :————.

4. ලාංකිකත්වය පරම්පරාවෙන්ද/ලියාපදිංචි වීමෙන්ද යන වග :————
(ලියා පදිංචිවීමෙන් නම් සහතිකයේ අංකය හා දිනය සඳහන් කළ යුතුයි.)

5. ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් :————.

6. ඉල්ලුම් කරන තනතුරට තමාගේ ඇති සුදුසුකම් පිළිබඳ විස්තර :————

7. පිළිගත් ආයතනවල සේවා කාලය :————.

| ආයතනයේ නම | තනතුර | සේවා කලාය | | අවු. | මාස |
|---|---|---|---|---|---|
| | | සිට | දක්වා | | |
| | | | | | |

8. චරිත සහතික ලබාගත් අයගේ නම් : 1.————.
2.————.

9. දනට රැකියාවක යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.

10. විශේෂ සුදුසුකම් ඇත්නම් ඒ පිළිබඳ විස්තර :————.

මවිසින් මෙම අයදුම් පතේ සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත් නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කර ඇති යම් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව, තෝරා ගැනීමට කලින් එළිදරව් වුවහොත් මගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ද, පත් කිරීමෙන් පසුව එළිදරව් වුවහොත්, කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

1–766—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ III පංතියේ පස් ඉවත් කිරීමේ යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුරු

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පවතින III වන පංතියේ පස් ඉවත් කිරීමේ යන්ත්‍රෝපකරණ ක්‍රියාකරු තනතුරු පිරවීම සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන ආකෘති පත්‍රය ප්‍රකාර පිළියෙල කළ ඉල්ලුම් පත් කොළඹ 2, තැ. පෙ. 509, වැඩ බලන වන සංරක්ෂක වෙත 1970 පෙබරවාරි මස 15 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය :—

2. **වැටුප් ක්‍රමය :**

(අ) කොළඹ නාගරික සීමාව සහ නාගරික සීමාවේ සිට සැතපුම් පහක (5) අරය තුල වූ ප්‍රදේශය තුල හෝ ඉංජිනේරු සහ කර්මාන්තශාලීය ආයතනයක් හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු ලැබ ඇති ආයතන වල සේවය කරන්නවුන් සඳහා පළමු හය මස තුල දිනකට ඒකාබද්ධ වේතනය රු. 7 සි. ඉන් පසු වාර්ෂික ඒකාබද්ධ වැටුප රු. 2,208—54×9—රු. 2,694 කි.

(ආ) පිට පළාත්වල ඉංජිනේරු සහ කර්මාන්තශාලීය ආයතන හැටියට භාණ්ඩාගාරය විසින් පිළිගනු නොලැබ ඇති ආයතන වල සේවය කරන්නවුන් සඳහා, පළමු හය මස තුල දිනකට රු. 6.50 ක් හා ඉන් පසු වර්ෂයකට ඒකාබද්ධ වැටුප රු. 2,154—54 × 8—රු. 2,586 කි.

3. **අවශ්‍ය සුදුසුකම් :**

(අ) 1. ලොරි පැදවීමේ බලපත්‍රයක් තිබිය යුතුය.
2. පස් ඉවත් කිරීමේ යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමේ දැනුම හා පැට්‍රල්, භූමිතෙල් සහ ඩීසල් වලින් ක්‍රියා කරන පස් ඇදීමේ යන්ත්‍රෝපකරණ අළුත්වැඩියා කිරීමේ හැකියාව.
3. කියවීමට හා ලිවීමට හැකියාව තිබිය යුතුය.
ඉහත (අ) හි සඳහන් සුදුසුකම්වලට අතිරේක පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය. එම සුදුසුකම් දක්වා ඇත්තේ වැඩි සැලකිල්ලක් ලැබෙන අනු පිළිවෙලිනි.

(අ) (අ) පිළිගත් බාහිර ආයතනයක III වන පන්තියට සමාන තත්වයක අදාල තනතුරක අවුරුදු 3 ක පළපුරුද්දක් තිබීම. (සහතික පත් මගින් සනාථ කළ යුතුය.) හා
(ආ) මනා චරිතයකින් යුක්තවීම. (වගකිවයුතු පුද්ගලයන් අත්සන් කළ චරිත සහතික ඉදිරිපත් කළ යුතුයි.)

**4. වයස් සීමාව :**

වයස අවු. 18 ට නො අඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රජයේ සේවයේ යෙදී සිටිනවුන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

**5. සේවයට බඳවාගැනීමේ කොන්දේසි :**

තනතුර ස්ථිරය. පත්කරනු ලබන්නවුන්ගේ විශ්‍රාම වැටුප් හිමිකම් 1964.2.7 වන දින අංක 633 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විධිවිධානයන්ට යටත් වනු ඇත.

6. අයදුම්කරුවන් විසින් පහත දක්වන ලිපි ලේඛනවල පිටපත් (මුල් ලිපි නොවේ) සිය ඉල්ලුම්පත්වලට ඇමිණිය යුතුය :—

(අ) උප්පැන්න සහතික පත්‍රය (හෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල රෙගුලාසි මාලාව වෙනුවෙන් නිකුත් කල සහතික පත් භාරගනු නොලැබේ).

(ආ) අධ්‍යාපනික සහතික පත්‍රය.

(ඇ) අයදුම්කරුගේ චරිතය හා තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාවය පිළිබඳ ළඟදී ලබාගත් සහතික පත් තුනක් (දැනටමත් රජයේ සේවයේ සිටින අයදුම්කරුවන්ගෙන් එවැනි සහතික පත් අනවශ්‍යය.)

7. මේ ගැසට් පත්‍රයේ පළමුවන භාගයේ දෙවන ඡේදයේ ආරම්භයේ දක්වා ඇති රජයේ සේවයේ පත්වීම්වලට බලපාන සාමාන්‍ය කොන්දේසි බලන්න.

8. නියමිත දිනයෙන් පසුව මේ කාර්යාලයයට ලැබෙන ඉල්ලුම්පත් ගැන සළකා බලනු නොලැබේ.

9. ඉල්ලුම්පත් හෝ තනතුර පිළිබඳ අනිකුත් ලිපි ඇත්නම්, ඒවා වැඩ බලන වන සංරක්ෂකට මිස මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුට පෞද්ගලිකව එවිය යුතු නොවේ.

ඩබ්ලිව්. ආර්. එච්. පෙරේරා,
වැඩ බලන වන සංරක්ෂක.

1970 ජනවාරි 21 වැනි දින,
කොළඹ 2, තැ. පෙ. 509,
වන සංරක්ෂකගේ කාර්යාලයේදීය.

**ආකෘති පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. ලාංකිකයෙකු වනුයේ පරම්පරාවෙන්ද, ලියාපදිංචි කිරීමෙන්ද යන වග :————.
4. (අ) උපන් දිනය :————.
   (ආ) 1970 පෙබරවාරි මස 15 දිනට වයස :—අවුරුදු :————, මාස :————.
5. දැනට තනතුරක් දරන්නේ නම්, ඒ කුමක්ද ? :————.
6. උසස්ම අධ්‍යාපනික සුදුසුකම් හා පළපුරුද්ද :————.
7. කලින් රැකියාවන්හි යෙදී සිටියේ නම් විස්තර :————.
8. විශේෂ සුදුසුකම් ඇත්නම් ඒවා දක්වන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

1–523—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

**ඇබෑර්තුව**

### විකුණුම් කළමනාකාර තනතුර

**සුදුසුකම් හා පළපුරුද්ද.**—අලෙවි සංවර්ධන කටයුතු පිළිබඳ අඩු වශයෙන් අවුරුදු 6ක පළපුරුද්දක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙකු නැතහොත් රජයේ හෝ අර්ධ රජයේ හෝ ප්‍රධාන වෙළඳ ආයතනයක අලෙවි සංවර්ධන කටයුතු පිළිබඳ අඩු වශයෙන් අවුරුදු 20ක පළපුරුද්දක් ඇති අය, එයින් අඩු වශයෙන් අවුරුදු 5ක් වත් විධායක තත්ත්වයක විය යුතුය. කඩදාසි වෙළඳාම පිළිබඳ පළපුරුද්දක් සහ කඩදාසි හා ඝන කඩදාසි ගැන මනා දැනීමක් තිබීම අතිරේක සුදුසුකමක් වශයෙන් සැලකේ.

**වයස.**—අවුරුදු 30 සිට 35 දක්වා.

වැටුප.—රු. 1,000—1,315 මාසික (සියලු දීමනා අඩංගු)
7×45

රජයේ දෙපාර්තමේන්තු, අර්ධ රජයේ දෙපාර්තමේන්තු හා රජයේ සංස්ථාවන්හි අයදුම්කරුවන්ගේ අයදුම් ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරුවන් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වන අතර, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා සහ විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා විධිවිධාන පනත ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පනවා ඇති හෝ මතු පනවන ලබන නියෝගයන් අනුව කටයුතු කළ යුතුය.

තෝරාගනු ලබන අයදුම්කරු, වාලච්චේනෙයි හෝ දිවසිනෝ පිහිටි සංයුක්ත මණ්ඩලයේ ඕනෑම ආයතනයක සේවය කළ යුතුවනු ඇත.

පත්කිරීම සඳහා තෝරාගනු ලබන අය ඔහුගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව වැටුප් පරිමාණයෙහි සුදුසු පියවරක හෝ උසස් පරිමාණයක තබනු ඇත.

මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල අයදුම්කරුවන්ගේ අත් අකුරින් සම්පූර්ණ කරන ලද අයදුම් 1970.2.15 දිනට හෝ ඊට පෙර, නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ සභාපතිතුමාට ලැබෙන සේ පහත ඇති ලිපිනයට එවිය යුතුය.

අයදුම්පත් තැපෑලෙන් ඉල්ලුම් කරන විට තමන්ගේ ලිපිනය සහිත මුද්දර ගැසූ දිග කවරයක් එවිය යුතුය.

මේ සඳහා ඉල්ලුම් කළ යුත්තේ අවශ්‍ය සුදුසුකම් ඇති අය පමණකි.

ති. බ. නාරන්පනාව,
සාමාන්‍යාධිකාරී,
නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1367,
356, යුනියන් පෙදෙස, කොළඹ 2.

1–760—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

**රසායනාගාර සහායකයින් බඳවා ගැනීම පිණිස පැවැත්වෙන විභාගය**

අංක 14,886 හා 1969.12.26 දින රජයේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය සම්බන්ධයෙනි. විභාගය සඳහා අයදුම් පත් භාරගන්නා අවසාන දිනය 1970 පෙබරවාරි මස 10 දින දක්වා දීර්ඝ කර ඇත.

එම්. එස්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1970 ජනවාරි 19 දින,
පේරාදෙනියේ,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේදීය.

1–514—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

භාණ්ඩාගාර අංකය : 1/23/21/8 (ජී).

**භාෂා පරිවර්තක සේවයට බඳවා ගැනීමේ විභාගය 1970-ජනවාරි**

1970 ජනවාරි මස 29 වැනි දින පැවැත්වීමට නියමිතව ඇති ඉහත සඳහන් විභාගය මතු දන්වන තුරු කල් දැමූ බව විභාගාපේක්ෂකයන් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ප. ධ. උඩුවෙල,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1970 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේදීය.

1–839—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායකයින්ගේ විභාගය 1967 නොවැම්බර්

අංක 14,829 සහ 1968 නොවැම්බර් 22 වැනි දින සහ අංක 14,851 සහ 1969 අප්‍රේල් 25 වැනි දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රවල පිළිවෙළින් පල කළ 1968 නොවැම්බර් මස 15 වැනි දින සහ 1969 අප්‍රේල් මස 14 වැනි දින දරණ නිවේදනවලට අමතරවයි. 1967 නොවැම්බර් මාසයේ පැවැත්වූ විභාගයේ ප්‍රතිඵල අනුව, පහත නම් සඳහන් අයදුම්කරුවන් ද තැපැල් ස්ථානාධිපති සහ සංඥාදායක සේවයට පත් කිරීම සඳහා තෝරාගෙන ඇති බැව් මෙයින් නිවේදනය කෙරේ :—

| නම | | ලිපිනය |
|---|---|---|
| අභයරත්න, හේ. මු. | ... | පුවක්වත්ත, මහ උස්වැව, කුරුණෑගල (හරහා). |
| අමිර්තනායගම්, රා. | ... | 1 වන සැතපුම් කණුව, කරෙයි නගර—බටහිර කරෙයිනගර්. |
| අබේගුණරත්න, වේ. හේ. | ... | "සෝමවිලා", දූව පන්සල පාර, දකුණු කළුතර. |
| කන්දසාමි, සී. | ... | වී. ඇම්. රත්නපාල මයා බාරේ, වැවගම, කුරුණෑගල. |
| කරුණාදාස, කා. කෑ. වි. | ... | කැල්ලපත, පිටිගල. |
| කරුණාදාස, වි. කො. | ... | උළුවාහේන, අළුත්වැවමුලන, සිටිනමළුව, තංගල්ල. |
| කරුණාරත්න, ර. ආ. සෝ. | ... | 544, ගොරකගහවත්ත, අග්ගෝන, අංගොඩ. |
| කරුණාරත්න, ව. වි. | ... | කපුගහතැන්න පාර, කළුගෙඩිහේන. |
| ගුණතිලක, ක. ර. | ... | නො. 487, රත්නපුර පාර, මූණගම, හොරණ. |
| ගුණසේන, ව. ආ. | ... | තැපැල් කාර්යාලය, හොරණ. |
| චන්ද්‍රදාස, වි. ප. | ... | ශ්‍රී සාරාලංකාර මාවත, වැලිව, මොරවක. |
| ඩිංගිරිබණ්ඩා, පි. ගෙ. | ... | මාකෙහෙල්වල, බැද්දෙවල. |
| ධර්මසේන, ලි. ජේ. | ... | "සඳසෙවන", 10, ගල්බොඩ, වතුරුගම. |
| තන්ගරාජා, නා. කා. | ... | මුරුගසියන් කෝවිල අසල, පුලෝලි දකුණ, පේදුරුතුඩුව. |
| තිරුචෙල්වම්, පො. | ... | පූලෝලු-බටහිර, තාම්බචෙට්ටි, පේදුරුතුඩුව. |
| ද සිල්වා, මා. ක්‍රි. ප්‍රේ. | ... | "ජස්ටින් විලා", බඩුගබඩා පාර, අළුත්ගම. |
| ද සිල්වා, හි. ස. | ... | කොබෙයිතුඩුව, බටපොල. |
| නන්දසේන, උ. ක. දො. | ... | තැපැල් කාර්යාලයීය ඉතිරි කිරීමේ බැංකුව, කොළඹ 3. |
| පරමේස්වරන්, වි. | ... | වඩ්ඩාපති, පුලෝලි බටහිර, පේදුරුතුඩුව. |
| පස්කරලිංගම්, සී. | ... | සූයාන්තරයි, කරනවායි දකුණ, කරවෙඩ්ඩි. |
| පෙරේරා, බ. සෝ. | ... | "නන්දන", පනාපිටිය, වස්කඩුව. |
| පෙරේරා, බැ. දො. පා. | ... | දම්බුළුවන, කහවත්ත, දොඩම්පෙ. |
| පෙරේරා, බූ. වි. | ... | "ලේක් සයිඩ්", වැවිට, බණ්ඩාරගම. |
| පෙරේරා, සු. දො. ජ. | ... | 111/5, නාගලගම් වීදිය, ග්‍රෑන්ඩ් පාස්, කොළඹ 14 |
| පොඩිඅප්පුහාමි, ලි. ආ. | ... | පූස්පනේ, උඩුගොඩ. |
| ප්‍රනාන්දු, මි. මා. මෙ. ලි. | ... | පල්ලිය පාර, වෙන්නප්පුව. |
| ප්‍රේමරත්න, වෙ. ගෙ. | ... | "හෙළ සෙවන", තිත්තපජ්ජල, වැරැල්ලගම. |
| බන්දුල රංජිත්, ක. ප. | ... | අංක 225, "කේසර", ගාළුපාර, පූවක්වත්ත. වැලිගම. |
| බන්දුලසේන, කු. වි. | ... | 303, සර්කියුලර් පාර, මාගාල්ල, ගාල්ල. |
| මහාලිංගම්, ක. | ... | දිස්ත්‍රික් විදුලි සන්දේශ පරීක්ෂක කාර්යාලය, ත්‍රිකුණාමලය. |
| යාපා, ම. | ... | නො. 32, ලේඩිටොරිංටන් පාර, මහනුවර. |
| ලියනගේ, ජී. හි. | ... | "වාසනා", මානම්පිට, මීටියාගොඩ. |
| වාහලවත්ත, සු. | ... | 98, පීරිස් මාවත, කළුබෝවිල, දෙහිවල. |
| වික්‍රමසිංහ, ගු. | ... | නාරන්වත්ත, ගංගොඩගම, හක්මන. |
| විතානවසම්, ච. | ... | ඩී. ඩබ්ලිව්. විල්සන් මයා බාරේ, ලංකා බැංකුව, වැල්ලවත්ත. |
| විජේපාල, ත. ගු. | ... | සී. ඊ. ඇන්. 253, කාලිංගඇල, පොළොන්නරුව. |
| විජයරත්න, හි. සී. | ... | සුගතදාසී මාවත, පිටිගල. |
| විජයසුන්දරම්, සී. | ... | ඇස්. චින්නයියා මිය බාරේ, ප්‍රෙෂ් පටුමග, කොකුවිල්. |
| විජේසූරිය, රා. ආ. | ... | "විජය නිවස", පිටකන්ද, අල්වත්ත. |
| විමලරත්න, ග. ප. | ... | නාසිම්බල, තිහගොඩ. |
| වේලායුදන්, මු. | ... | මෙයිහන්ඩන් ප්‍රෙෂ් පටුමග, මද්දුවිල් උතුර, චාවකච්චේරිය. |
| සිවපාතසුන්දරම්, වේ. | ... | 34, අයියනාර් කෝවිල් වීදිය, වන්නාර්-පොන්නෙයි, යාපනය. |
| සිවරාජා, ක. | ... | කච්කුලි, පෙරුන්කුලම්, චාවකච්චේරිය. |
| සුන්දර රාජා, මු. | ... | දීගල්ලවත්ත, දෙහිඹවිට. |
| සුන්දරලිංගම්, සෙ. | ... | නාගාර් කෝවිල්, කුඩතනෙයි, කරවෙඩ්ඩි. |
| සුරවීර, ක. | ... | "ශ්‍රීසර", වැවහමන්දුව, මාතර. |
| සෝමපාල, කෝ. පො. | ... | කන්දේගම, අල්ගම. |
| හේමසීල, නා. හ. | ... | බෝගහවත්ත, අම්බලන්ගොඩ. |

2. මෙම අපේක්ෂකයින්ට වහාම තනතුරු සැපයීමට ආණ්ඩුව පොරොන්දු නොවේ. එහෙත් පුරප්පාඩු ඇතිවන පරිද්දෙන් ඔවුනට පත්වීම් දෙනු ඇත. සියලුම පත්වීම් අවුරුදු තුනක ආධුනික කාලයකට සහ සේවය පිළිබඳ කොන්දේසිවලට යටත් වේ.

3. යථා කාලයේදී මා විසින් අපේක්ෂකයින් වෙත ලියා දන්වනු ඇත.

වී. ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ.

1969 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ-1, ලෝටස් පාරේ,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයෙහි,
6 වන මහලෙහි පාලන අංශයේ දී ය.

1–713—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

### සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යතුරුලියන සැපයීම

1969. 12. 19 දින අංක 14,885 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය මඟින් කැඳවන ලද ඉහත සඳහන් සැපයීම සඳහා වූ ටෙන්ඩර් පත්‍ර බාර ගැනීමේ අවසාන දිනය 1970 පෙබරවාරි 3 වැනි දින තෙක් දීර්ඝ කර තිබෙන බව ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තුවන ටෙන්ඩර්කරුවන් කරුණාවෙන් සලකන්න.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1970 ජනවාරි 29 දින,
කොළඹ දීය.

1–773—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පහ සඳහන් ස්ථානයන්හි විදුලිබල පේෂ කර්මාන්ත ශාලාවල විශ්‍රාම කාමර ඉදිකිරීම සඳහා කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1970 පෙබරවාරි මස 19 වැනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ :—

(1) මාවනැල්ල
(2) සංගිලිපාලම
(3) බණ්ඩාරවෙල
(4) ගම්පොල
(5) මහගස්තොට

2. යම්කිසි දෙපාර්තමේන්තුවක රු. 25,000කට හෝ එයට වැඩි මුදලකට හෝ ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැක.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගි වීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් එක් වැඩකට රු. 100 බැගින් ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1970 පෙබරවාරි මස 18 වන දින පෙරවරු 12ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර්පත් ලබාගත යුතු වේ.

පී. එච්. පී. ද සිල්වා,
අධ්‍යක්ෂක,
ග්‍රාම සංවර්ධන සහ කුඩා කර්මාන්ත
දෙපාර්තමේන්තුව.

යොමුව : සීඒ/ඩී/196, සීඒ/ඩී/197 සහ සීඒ/ඩී/198, සීඒ/ඩී/199, සීඒ/ඩී/200.

1970 ජනවාරි මස 17 වැනි දින,
කොළඹ 7.

1–752—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### ගාල්ල වරාය රුමස්සල වැඩපලේ ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාල සීමාවකට යථෝක්ත ආපන ශාලාව බදු දීම සඳහා සිල් තබන ලද ටෙන්ඩර් 1970.2.19 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම පෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25ක් තැන්පත් කිරීමෙන් පසුව ය.

3. 1970.2.16 වැනි දින පස්වරු 2.30 වන තුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ඇත.

1–508—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### බේරේ කාර්මික සංවර්ධන අංශයේ ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාල සීමාවකට යථෝක්ත ආපන ශාලාව බදු දීම සඳහා සිල් තබන ලද ටෙන්ඩර් 1970.2.19 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම පෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25 ක් තැන්පත් කිරීමෙන් පසුව ය.

3. 1970.2.16 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ඇත.

1–512—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### එළිසබෙත් රැජින වේදිකාවේ පිහිටි සංවර්ධන අංශයේ ආපන ශාලාව

වරාය කොමසාරිස් විසින් නියම කරනු ලබන දිනක සිට අවුරුද්දක කාල සීමාවකට යථෝක්ත ආපන ශාලාව බදුදීම සඳහා සිල් තබන ලද ටෙන්ඩර් 1970.2.19 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. වරාය කොමිෂන් සභා කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුය. මෙම පෝර්ම ලබාගත හැකි වන්නේ වරාය කොමිෂන් සභාව වෙත රු. 25ක් තැන්පත් කිරීමෙන් පසුවය.

3. 1970.2.16 වැනි දින පස්වරු 2.30 වනතුරු කාර්යාලයේ වැඩ කරන වේලාවල ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

4. බද්ද පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පෝර්ම සමග නිකුත් කරනු ඇත.

1–511—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කෑගල්ල දිස්ත්‍රික්කය

### සංවර්ධන වැඩ කරවා ගැනීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත විස්තර දක්වා ඇති සේවාව සඳහා 1970 පෙබරවාරි 5 වෙනි දින, දවල් 10 දක්වා ග්‍රාම සංවර්ධන සමිතිවලින් ද, සමූපකාර සමිතිවලින් ද සහ වාරිමාර්ග, රජයේ වැඩ දුම්රිය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති (රු. ............... දක්වා) කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. ටෙන්ඩර් එදිනම සවස 3 ට විවෘත කරනු ලැබේ.

| ජනපදයේ නම | | ප්‍රා.ආ.නි. කොට්ඨාශය | | වසම |
|---|---|---|---|---|
| කොබ්බෑවල | ... | බෙලිගල් කෝරලය | ... | කොබ්බෑවල |
| රූනපාන | ... | බෙලිගල් කෝරලය | ... | ඉඹුල්ගල |
| ගොරොක්ගහකැලේ | ... | කිනිගොඩ | ... | ගල්පොල |
| ඝබල්මන්ට් | ... | එම | ... | ගබ්බල |
| මාලිගාතැන්න | ... | එම | ... | හේවාදිවෙල |

2. කෑගල්ල දිසාපතිතුමාගෙන් ටෙන්ඩර් පත්‍ර ලබාගෙන, ටෙන්ඩර් පත්‍ර ඒවායේ එවිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරනු ලබන කවරයේ වම් උඩ කෙලවරේ "................................" (ඒ ටෙන්ඩරයේ නම සඳහන් කරන්න) යන්න සඳහන් කර සීල්තබා දිසාපති, කෑගල්ල යන්න එහි ලිපිනය පැහැදිලිව ලියා ලේඛනගත තැපැලෙන් එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් සහ අනුපිටපත් සහිතව එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත්‍ර ලේඛනගත තැපැලෙන් නොඑවතොත්, ටෙන්ඩර් කරුවන් හෝ ඔහුගේ නියෝජිතයන් විසින් ඒවා අතින් ටෙන්ඩර් පත්‍ර දිසාපති වෙත හෝ ඔහුගෙන් බලය ලත් නිලධාරිතුමා වෙත පුද්ගලිකව භාර දිය යුතුයි.

4. ලියා පදිංචි කළ තැපැලෙන් එවනු ලබන සියළුම ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ටෙන්ඩර් විවෘතකරන දිනයේම ටෙන්ඩර් කරුවන් වෙත එවනු ලැබේ. යම් ටෙන්ඩර් කරුවෙකු ටෙන්ඩර් වසන දිනයේ සිට දින 4 ක් තුළ එවැනි ලිපියක් නොලැබුණහොත් ඔහු වහාම දිසාපතිගෙන් ඒ ගැන විමසිය යුතුයි. එසේ කරුණු විමසීමේ දී ටැන්ඩරය පිළිබඳ විස්තරත්, ටෙන්ඩර් කරුගේ ලිපිනයත්, ටෙන්ඩරය ලේඛනගත තැපැලෙන් යවනු ලැබී නම් එහි ලේඛනගත ලිපියේ අංකයත් දැක්විය යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම නැවැත්වීමට නියමිත දිනයේ උදේ 9.30 වනතෙක් ටෙන්ඩර් පත්‍ර දෙනු ලැබේ. එවේලේ නිකුත් කරනු ලබන සෑම ටෙන්ඩරයක් වෙනුවෙන්ම රු. 25 ක් කෑගල්ලේ දිසාපතිතුමා නමින් තැන්පත් කර ඒ වගට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. මෙසේ ටෙන්ඩර්

මුදල් තැන්පත් කිරීම ලංකාවේ ඕනෑම දිසාපති කාර්යාලයක දී කළ හැකිය. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවා එසේ ඔහුගේ ටෙන්ඩරය තෝරාගත් බව දන්වා සති තුනක් ඇතුළත, අවශ්‍ය ඇප මුදලක් තැන්පත් කර සේවාව සතුටුදයක ලෙස අවසන් කිරීම සඳහා ගිවිසුම්පත් අත්සන් කළ යුතුයි. එසේ කිරීම නොවුවහොත්, ඒ ටෙන්ඩර්කරුවාගේ නම වැඩ පැහැර හැරිය ටෙන්ඩර්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කරනු ලැබේ. තෝරාගනු ලැබුවාවූ ටෙන්ඩරයේ වටිනාකමින් 5%ක ඇප මුදලක් තැන්පත් කළ යුතුයි. එසේ මුදල් තැන්පත් කිරීම ලංකාවේ ඕනෑම දිසාපති කාර්යාලයක දී කළ හැකියි.

6. නියමිත ටෙන්ඩර් පෝරමයේ ලියා නැති හෝ නියමිත කොන්දේසි වලට පටහැනිව සකස් වී ඇති සියළුම ටෙන්ඩර් පත්‍ර, පිළිගත හැකි ටෙන්ඩර් පත්‍ර ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් හා ගණන් ඉතා පැහැදිලිව තීන්තෙන් ලිවිය යුතු අතර, එහි යම් වෙනස් කිරීමක් හෝ කපා ගෑමක් ඇත්නම් එය ටෙන්ඩර් කරුගේ කෙටි අත්සන යොද අවලංගු කළ යුතුයි.

7. ටෙන්ඩරයේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ඉතා පැහැදිලිව ලිවිය යුතුයි.

8. යම් ටෙන්ඩරයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ නැතිනම් ටෙන්ඩරයකින් කොටසක් පිළිගැනීමේ අයිතිය ටෙන්ඩර් මණ්ඩලය වෙත තබා ගනු ලැබේ.

9. පත්කර ගනු ලැබුවාවූ ටෙන්ඩර්කරුවන් එම සේවාව සඳහා "ලාංකික" කම්කරුවන් පමණක් ගතයුතුයි ලාංකිකයන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත් තෙක්ය යන්නයි.

10. 1934, 19 වැනි අංකය දරන කම්කරු ආඥාපණතේ (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ සේවකයෙකු වෙනුවෙන් වන්දිය ඉල්ලා ඉල්ලා එවනු ලබන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

11. කොන්ත්‍රාත්කරුවාට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත්, නැතහොත් ඔහු විසින් කොන්ත්‍රාත්කරුගේ ලිපිනයට තැපෑලෙන් යැවුවහොත්, එය ඔහුගේ අතට භාර දුන්නාසේ සැලකිය යුතුයි.

12. වැඩට ගැනීම නුසුදුසුයයි කල්පනා කරන යම් සේවකයෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම සේවකයෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය ආණ්ඩුවට තබා ගනු ලැබේ.

13. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනිතනිව හෝ එම ලැයිස්තුවේ නම සඳහන් වන කෙනෙකු සමග නම ඇතුළත්ව–හෝ ටෙන්ඩර් මණ්ඩලය විසින් විරුද්ධවන කිසිවකු හෝ කොන්ත්‍රාත්තුවට බැඳෙනු නොලැබේ.

14. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකට වත් වෙනස් නොවන ඒවා විය යුතුයි.

15. මේ පිළිබඳව වැඩි විස්තර කෑගල්ලේ දිසාපති කාර්යාලයේ ඉඩම් අංශයෙන් සතියේ වැඩ කරන දිනවල උදේ 9 සිට සවස 4.30 දක්වා ලබාගත හැකියි.

16. 5 වැනි වගන්තිය යටතේ සඳහන් ටෙන්ඩර් පෝර්ම සඳහා මුදල් හෝ ඇප මුදල් තැන්පත් කිරීමට ග්‍රාම සංවර්ධන සමිති හෝ සමුපකාර සමිති හෝ කම්කරු සමිති බැඳී නැත.

17. 16 වැනි වගන්තිය යටතේ සමිති දැනට ක්‍රියාත්මක සමිති බවට ග්‍රාම සංවර්ධන උප අධ්‍යක්ෂගෙන් සමුපකාර සංවර්ධන උප කොමසාරිස් සහ කම්කරු උප කොමසාරිස්ගෙන් සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

ජී. පී. හත්තොටුව,
කෑගල්ලේ දිසාපති වෙනුවට.

1970 ජනවාරි 12 වැනි දින,
කෑගල්ලේ දිසාපති කාර්යාලයේ දී ය.

1–695—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—ගම්පහ උප කොටස

ගම්පහ උප කොටසේ පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් අයදුම් පත් 1970 පෙබරවාරි 23 වන සඳුදා දවල් 11 දක්වා ජාවත්ත පාරේ කොළඹ 5 බස්නාහිර උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම එහිදී සිදු කෙරේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පහත සඳහන් වැඩ ඉදිරියෙන් දක්වා ඇති අයුරු හෝ ඊට වැඩි ගණන් වලට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම්පත් ඉදිරිපත් කල හැක :—

3. (1) පුස්වැලි මුල්හේන වැව නැනීම රු. 1,00,000. ටෙන්ඩර් තැන්පත් 100.

(2) අළුත් ඇල ගල්වාන අමුණ නැනීම රු. 80,000. ටෙන්ඩර් තැන්පත්. රු. 100.

4. 1970 ජනවාරි 29 වෙනි දින සිට 1970 පෙබරවාරි 16 වෙනි දින දවල් 12.00 දක්වා ගම්පහ/කළුතර/රත්නපුර/සහ කොළඹ වාරිමාර්ග ඉංජිනේරුවරුන්ගේ කාර්යාලයන්ගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝරමවල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් පෝරම සඳහා ඉදිරිපත්වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඔවුන් දැනට කරණ වැඩ හා ඒවායේ වටිනාකම දක්වෙන ප්‍රකාශණයක්, ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි.

5. තවද, ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට ප්‍රථම එක් එක් ටෙන්ඩරය වෙනුවෙන් වැඩය ඉදිරියෙන් දක්වා ඇති අයුරු ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් කාර්යාලවල හෝ ලංකාවේ ඕනෑම කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කල යුතුයි.

6. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුලදී ගම්පහ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

ජේ. පරමදාස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන—ගම්පහ උප කොටස.

වාරිමාර්ග කාර්යාලය,
ගම්පහ, 1970. 1. 13.

1–685—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—කුරුණෑගල උප කොට්ඨාශය

කුරුණෑගල උප කොට්ඨාශයේ පහත සඳහන් ඉදිකිරීම් වැඩ සඳහා ටෙන්ඩර් පත් 1970 පෙබරවාරි මස 18 වෙනි බදාදා පෙ.ව. 10 දක්වා කුරුණෑගල වයඹ කොට්ඨාශයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවෙලේම එහිදී සිදු කෙරේ.

| වැඩ විස්තරය | | ටෙන්ඩර්කරුගේ ලියාපදිංචි මුදල රුපියල් | | ටෙන්ඩර් තැන්පත් මුදල රුපියල් |
|---|---|---|---|---|
| 1. මාරපහඹිය බැම්ම ඉදිකිරීම | ... | 35,000 | ... | 50 |
| 2. මාහර ගම බැම්ම ඉදිකිරීම | ... | 25,000 | ... | 25 |

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ඉහතින් දක්වෙන ප්‍රමාණයට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිති වලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළ හැකිය.

3. 1970 පෙබරවාරි මස 13 වෙනි සිකුරාද (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුළදී කුරුණෑගල/නිකවැරටිය/පුත්තලම උප කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත් හැකි ආකෘති පත් වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත් සඳහා ඉල්ලුම් කිරිමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ ඒවායේ වටිනාකම·දක්වෙන ප්‍රකාශනයක් ඔවුනට ටෙන්ඩර් කිරිමට ඉඩ ලැබිය යුතුද ? නැද්ද ? යන්න සළකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘති පත් නිකුත් කිරීමට ප්‍රථම ඉහත දක්වෙන පිළිවෙළට ටෙන්ඩර් තැන්පත් මුදල් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මෙම ටෙන්ඩරය ගැන සියළුම විස්තර, ගිවිසුම, වැඩය පිළිබඳ සැළසුම, විශේෂ විස්තර යනාදිය කාර්යාල වේලාවන් තුළදී කුරුණෑගල උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

එල්. හරිදස,
වාරිමාර්ග ඉංජිනේරු
කුරුණෑගල උප කොට්ඨාශය.

1970 ජනවාරි මස 11 වෙනි දින,
කුරුණෑගල, වාරිමාර්ග කාර්යාලයේ දී ය.

1—673—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහනුවර උප කොටස

මහනුවර උප කොටසේ "අංක 8 දරණ තනිකඩ නිලධාරීන්ගේ නිවාසය ඉදිකිරීම" සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර කුන්ඩසාලේ වාසී, මධ්‍යම කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1970.2.19 දින පෙ. ව. 10 තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කරනු ලැබේ.

2. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 35,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට පමණක් මෙම වැඩය සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

3. 1970.2.16 දින ප. ව. 4.30 දක්වා (එදින ඇතුළුව) කාර්යාල වේලාවන් තුල පමණක් මහනුවර/මාතලේ/හසලක/නුවරඑළිය යන වාරිමාර්ග කාර්යාලයකින් ලබා ගතහැකි ආකෘතිපත්වල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් ආකෘතිපත් ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරන වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දක්වන ප්‍රකාශයක්, ඔවුන්ට ටෙන්ඩර් පත් ඉදිරිපත් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුයි. ආකෘතිපත් නිකුත් කිරීමට පළමු රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉහත සඳහන් ඕනෑම වාරිමාර්ග කාර්යාලයක හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

4. ටෙන්ඩර්පත් දෙපිට පතකින් ඉදිරිපත් කළ යුතුවා මෙන්ම ලියාපදිංචි කළ සීල් තබන ලද කවරයක බහා එවිය යුතුය. "කුන්ඩසාලේ අංක 8 දරණ තනිකඩ නිලධාරීන්ගේ නිවාසය ඉදිකිරීම" යනුවෙන් කවරයේ වම් උඩ කෙළවරේ පැහැදිළිවම සඳහන් කළ යුතුයි.

5. ටෙන්ඩරය පිළිබඳ වෙනත් අදාල විස්තර හා සැලසුම් ආදිය රාජකාරි වේලාවන් තුලදී මහනුවර වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

ඒ. ජී. ජේ. ද පින්ටෝ,
මහනුවර වාරිමාර්ග ඉංජිනේරු,
මහනුවර උප කොටස.

1970.1.13 දින කුන්ඩසාලේ දී ය.

1–829—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මාතලේ උප කොට්ඨාශය

මධ්‍ය කොට්ඨාශය භාර නත්තරන්පොත කුණ්ඩසාලේ වාසී ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මාතලේ උප කොට්ඨාශය යටතේ දඹබැදරුප්ප හෙවත් වැවතැන්න වැව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ටෙන්ඩර් පත් 1970 පෙබරවාරි මස 25 වෙනි බුද දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

2. මෙම දෙපාර්තමේන්තුවේ රු. 83,000 කට හෝ ඊට වැඩි ගණන කට ලියා පදිංචිවී ඇති කොන්ත්‍රාත් කරුවනට, සමුපකාර සමිතිවලට සහ ග්‍රාමසංවර්ධන සමිතිවලට පමණක් ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක.

3. 1970 පෙබරවාරි මස 11 වෙනි දින සිට 1970 පෙබරවාරි මස 24 වෙනි දින දක්වා සාමාන්‍ය කාර්යාල වේලාවන්හිදී මාතලේ වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝරම්වල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුය. ටෙන්ඩර් ෆෝරම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියාපදිංචි පොත් සහ දැනට ඔවුන් කරණ වාරිමාර්ග වැඩ සහ ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයන් ඔවුන්ට ටෙන්ඩර් කිරීමට ඉඩදිය යුතුද නැද්ද යන්න සලකා බැලීම සඳහා වාරිමාර්ග ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම වැඩය යන්ත්‍රෝපකරණ මගින් කළයුතුව ඇති නිසා ටෙන්ඩර් කරුවන් ඔවුන් සතුව ඇති යන්ත්‍රෝපකරණවල ලැයිස්තුවක් ද ඉදිරිපත් කළ යුතුය. සුදුසු යන්ත්‍රෝපකරණ ඔවුන් සතුව ඇති බවට ඒත්තු ගිය හොත් පමණක් ටෙන්ඩර් පත් නිකුත් කිරීම ගැන සලකා බලනු ලැබේ.

4. ටෙන්ඩර්පත් නිකුත් කිරීමට පෙර රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ සඳහා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

5. මේ ටෙන්ඩරය ගැන සියලු විසත්ර කාර්යාලයීය වේලාවන් තුළදී මාතලේ වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කාර්යාලයේදී ලබාගත හැක.

සී. කනගලිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මාතලේ උප කොටස.

1970.1.18 දින,
මාතලේ වාරිමාර්ග කාර්යාලයේ දී ය.

1–826—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මහනුවර උප කොටස

1970.1.9 දින රජයේ ගැසට් පත්‍රයෙහි පලවූ දැන්වීම හා සම්බන්ධයි.

පල්ලෙකැලේ නව නගරයෙහි යෝජිත ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සඳහා ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය 1970. 2. 12 දක්වා දිගු කරන ලදී. මේ අනුව ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය 1970. 2. 10 දක්වා කල්දී ඇත.

ඒ. ජී. ජේ. ද පින්ටෝ,
මහනුවර වාරිමාර්ග ඉංජිනේරු.

වාරිමාර්ග කාර්යාලය,
කුන්ඩසාලේ, 70. 1. 18 දින දී ය.

1–515—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### ජල නල සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවීම

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 හි පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ජල නල හතක් (7) සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, 1970 පෙබරවාරි 20 වන සිකුරාදා දවල් 2.30 දක්වා භාරගනු ලැබේ.

2. මෙම ජල නල සඳහා නියමිත විස්තර පහත දැක්වේ.

"මෙම ජල නල විදුලි බලයෙන් ක්‍රියා කරන, මෝටරයෙහි සම්බන්ධ කළ බර වැඩට යෝග්‍ය ඒවා විය යුතුය. ජලය ඇදගන්නා නලය 2" ක්ද, චූෂන ශක්තිය (Suction Head) අඩි 25 ක්ද, විසර්ජන ශක්තිය (Delivery Head) අඩි 60 ක්ද, උස අඩි විස්සේදී පැයට දල වශයෙන් ගැලුම් 800 ක් ජලය ඇදීමේ ශක්තියක්ද ඇති යන්ත්‍රයක් විය යුතුය. මෝටරයේ ප්‍රමාණය යටත් පිරිසෙයින් අ. බ. $\frac{3}{4}$ ක් වියයුතු අතර එය වෝල්ට් 230 ක සයිකල් 50 ඒ සී. විදුලි බලයෙන් ක්‍රියා කළයුතුය. මෝටරය සමග ඊට අවශ්‍ය පා කපාටය (Foot Valve) පරහනය (Strainer) ක්‍රියාරම්භක ස්විච් විලායකය (Fuse) සැපයිය යුතුයි.

3. ටෙන්ඩර් කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන වර්ගවල සම්පූර්ණ විස්තර සඳහන් කළයුතුය.

4. මේ පිළිබඳ ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් ඉදිරිපත් කළ යුතුය. ඒ සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර, රු. 50 ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 හි ගොවිජන සේවා කොමසාරිස් වරයාගෙන් ලබා ගතහැකිය. කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60 හි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී වෙත හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක මෙම මුදල් තැන්පත් කළ යුතුයි. 1970.2.20 දින දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. මේ සම්බන්ධයෙන් අවශ්‍ය වන වෙනත් තොරතුරු ඇතොත් කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 හි ගොවිජන සේවා කොමසාරිස් වරයාගෙන් ලබා ගතහැකිය.

ඩී. තී. නවරත්න,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1970.1.29 වැනි දින,
කොළඹ 7,
42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

1–513—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ—පට්ටි මධ්‍යස්ථාන ඉදි කිරීම

මෙහි පහත සඳහන් ස්ථානවල ඇති පට්ටි මධ්‍යස්ථාන ගොඩනැගිලි ඉදි කිරීම සඳහා කොළඹ—5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.3.2 වෙනි දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. එක් එක් ස්ථානයට යටත්ව ඇති ගොඩනැගිලි සඳහා වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කල යුතු අතර එක් එක් ස්ථානය වෙනුවෙන් හෝ ස්ථාන කිහිපයක් වෙනුවෙන් හෝ ටෙන්ඩර් කිරීමට අවකාශ ඇත :—

(අ) නුවර වැව.

(ආ) හොරොව්පතාන.

'(ඉ) මරදන්කඩවල.

(ඊ) මිනිපේ.

(උ) මයියන්ගනය.

2. කොළඹ—5, නාරාහේන්පිට, පලතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු අංශයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝර්ම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන් විශේෂ විස්තර හා වෙනත් තොරතුරු ද, ලබා ගත හැකිය.

3. සෑම ටෙන්ඩර් කරුවෙකුම රු. 5,000 කට නොඅඩු කොන්ත්‍රාත් භාර ගැනීමට ටෙන්ඩර් කරුවන් විශයෙන් රජයේ ලියා පදිංචි විය යුතුය.

4. පහත සඳහන් ලිය කියවිලි ඉදිරිපත් කල විට 1970 පෙබරවාරි මස 19 වෙනි දින ප. ව. 4 දක්වා ටෙන්ඩර් පත් ලබාගත හැකිය :—

(අ) 3 ඡේදයේ සඳහන් අයුරු ලියා පදිංචි වී ඇති බව ඔප්පු කිරීම.

(ආ) එක් එක් ස්ථානය වෙනුවෙන් රු. 25 බැගින් ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක්.

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂකවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් විදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට,
කොළඹ—5.
1970.1.19.

1–501—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

රජයේ ගොවිපල්වල අයිආර් 8 ගොයම් කැපීම, ප්‍රවාහනය කිරීම හා ගොඩගැසීම සඳහා ටෙන්ඩර් පත් කැඳවීමයි.

අංක : 14,885 හා 69. 12. 19 වැනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ තිබෙන ඉහත සඳහන් කාරණය සම්බන්ධයෙන් පරන්තන් සහ මුරුන්කන් රජයේ ගොවිපලවල ටෙන්ඩර් පත්‍ර භාරගැනීම 70. 2. 10 වැනි දින පෙ. ව. 10 දක්වා දීර්ඝ කර ඇත.

පී. ඊ. ජිනේන්ද්‍රදාස,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂක,
(කෘෂිකර්ම අධ්‍යාපන හා ගොවිපල්.)

පේරාදෙණිය.
1970. 1. 16.

1–784—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### පිදුරු සහ තණකොල සැපයීම

1970 මාර්තු මාසයේ මැද භාගයේ සිට දින 30ක පමණ කාලයට ගවයින් 1000 කගේ ප්‍රයෝජනය සඳහා පහත සඳහන් ස්ථානවලට ඒ ඒ දිනයන්හි ඉල්ලනු ලබන ප්‍රමාණයන්ගෙන් පිදුරු සහ තණකොල සැපයීම හා ගෙන ගොස් භාර දීමට සීල්තබා එවන ටෙන්ඩර්, කොළඹ 2, වොක්සෝල් වීදියේ, අංක 315 දරණ ස්ථානයේ, කෘෂිකර්ම පොර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.2.24 දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

| ස්ථානය | ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|---|
| 1. වැලිසර රජයේ සත්ව ගොවිපල | (i) පිදුරු ... | එක් දිනකට රාත්තල් 3,000 පමණ |
| | (ii) තණකොල | එක් දිනකට රාත්තල් 20,000 පමණ |
| 2. කොළඹ 2, මෝගන් පාරේ, සත්ව නිරෝධායන මධ්‍යස්ථානය | (i) පිදුරු ... | එක් දිනකට රාත්තල් 3,000 පමණ |
| | (ii) තණකොල | එක් දිනකට රාත්තල් 6,000 පමණ |

විස්තර :

(අ) සපයනු ලබන පිදුරු ගව ආහාරයට සුදුසු අළුත් ගොම් පිදුරු වියයුතු අතර, මිටියක බර රාත්තල් 28ක් විය යුතුය.

(ආ) සපයන තණකොල නොවියළුණු හා ගව ආහාරයට සුදුසු ඒවා වියයුතු අතර මිටියක බර රාත්තල් 10ක් විය යුතුය.

2. තෝරාගත් කොන්ත්‍රාත්කරුට ඒ බව දන්වූ පසු, ඉහත සඳහන් ස්ථානවල භාරකාර නිළධාරීන් විසින් නියම කරන දිනක සිට ඉහත සඳහන් අවශ්‍යතාවයන් දින 30 ක් සැපයිය යුතුය.

3. නිසි ප්‍රමාණයෙන් යුක්ත නොවූ හෝ සත්ව ආහාර සඳහා යෝග්‍ය නොවූ හෝ අදල කොන්දේසිවලට එකඟ නොවන කිසිම සැපයුමක් භාර නොගන්නා අතර, එවැනි ප්‍රතික්ෂේප කරනු ලබන සැපයුමක් වෙනුවෙන් කවර විදියේ හෝ අලාභයක් ගෙවීමට දෙපාර්තමේන්තුව බැඳෙනු නො ලැබේ.

4. කොළඹ 2, වෝක්ෂෝල් වීදියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය කර්යාලයේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂගෙන් 1970.2.1 දිනට පසුව ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර පිළියෙල කර එවිය යුතුය. සියළුම ටෙන්ඩර් පත්‍ර නිවැරදිවත්, පැහැදිලිවත් සම්පූර්ණ කළ යුතු අතර යම්කිසි වෙනසක් කළහොත් ඒ එක් එක් වෙනස් කිරීමට කෙටි අත්සන තැබිය යුතුය. නියමිත අයුරු සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පෝර්ම පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා සීල් තබා ''සභාපති ටෙන්ඩර් මණ්ඩලය, සත්ව පාලන හා සෞඛ්‍ය අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වෝක්ෂෝල් වීදිය, කොළඹ 2'' යන ලිපිනයට එවිය යුතු අතර එම කවරයේ වම් උඩ කෙළවරේ ''තණකොළ සහ පිදුරු සැපයීම සඳහා ටෙන්ඩර්'' යන්නද ලිවිය යුතුය.

5. ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කර එවිය යුතුය. අතින්ම ගෙනවිත් භාරදිය හැකි ටෙන්ඩර් පත්‍රද ඉහත සඳහන් ඡේදයේ පරිදි සකස් කර ඉහතකී කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය. ලියාපදිංචි කරන ලද තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුන බව යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට එම ටෙන්ඩර් විවෘත කිරීමට නියමිත දින සිට දින 4ක් ඇතුළත දී නොදන්වුව හොත් ඒ සම්බන්ධයෙන් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙන් විමසිය යුතුය.

6. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත දිනය 1970.2.24 දින දවල් 12 තෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ. එම නිකුත් කිරීම කරනුයේ එක් පෝර්මයක් වෙනුවෙන් රු. 10 බැගින් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළහොත් පමණි. මුදල් තැන්පත් කළ යුත්තේ ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නැතහොත් කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු ශාඛාවේ ඇති අංක 37 දරණ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමටය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන්නේ නම් එම බැංකුව විසින් සපයන පොදු ආකෘති පත්‍ර අංක 118 සම්පූර්ණ කර බැංකුවට ඉදිරිපත් කළ යුතුය.

7. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ඉදිරියේ පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසාන දින නියමිත වේලාවට ලැබී ඇති ටෙන්ඩර් කොළඹ 2, වොක්ෂෝල් වීදියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේදී විවෘත කරන ලදී.

8. නියමිත පෝර්මයේ ලියා නැති නියමිත ලෙස කොන්දේසි ඉටුවී නැති ටෙන්ඩර්, ටෙන්ඩර් ලෙස නොසලකන අතර, නියමිත දිනෙන් පසු ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය පැහැදිලිව ටෙන්ඩරයේ ලිවිය යුතුය.

10. පිළිගත් ටෙන්ඩර්කරු ඒ බව දන්වූ ද සිට දින 10ක් ඇතුළතදී ටෙන්ඩරයේ සඳහන් වූද, පිළිගනු ලැබූවාවූද දේවල සම්පූර්ණ වටිනාකමින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමින් තැන්පත් කිරීමටත් පොරොන්දු පත්‍රයක් අත්සන් කිරීමටත් සිදුවනු ඇත. පොරොන්දු පත්‍රය

අත්සන් කරනු ලැබූ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. තෝරාගත් ටෙන්ඩර්කරු ඒ බව දන්වූ ද සිට දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීමට හෝ ගිවිසුම් පත්‍රයකට බැඳීමට නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඔහුගේ කොන්ත්‍රාත්තුව අවලංගු කර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.

11. ගිවිසුම් පත්‍රයට හෝ පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම ටෙන්ඩර්කරු විසින් දැරිය යුතු අතර, එම ගිවිසුමට හෝ පොරොන්දු පත්‍රයට අත්සන් තැබීම සඳහා සාක්ෂිකරුවන් දෙදෙනෙකුද තමාගේ වියදමෙන් ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කළ යුතුය. මෙම සාක්ෂිකරුවන් මැනවැයි කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් සෑහීමකට පත්විය යුතුය.

12. යම්කිසි ටෙන්ඩර්පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටත් ටෙන්ඩර් පත්‍රයක කොටසක් පමණක් පිළිගැනීමටත් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත බලය ඇත්තේය.

13. පත්කරනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ටෙන්ඩරයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද වැඩය කරවීම සඳහා යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණි. මෙහි ''ලාංකික'' යන්නේ අදහස පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් ලංකා පුරවැසි බව ලබා ගත් අය යන්නයි.

14. 1931 අංක 19 දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයකු හෝ සේවකයින් වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම්පත්‍ර වලින් කොන්ත්‍රාත්කරු ආණ්ඩුව නිදහස් කළ යුතුය.

15. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතටම භාරදුන්නොත් හෝ ඔහු විසින් ඉදිරිපත් කර ඇති ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් හෝ ඔහුගේ නියෝජිතයෙකුට බාර දුන්නොත් හෝ ඔහුගේ අතටම භාර දුන්නා සේ සැලකේ.

16. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ එම ලැයිස්තුවේ නම් සඳහන් අය සමග නම් යෙදී ඇති හෝ තමාට සැහේ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂ විරුද්ධත්වය ප්‍රකාශ කරන කවර අයකු සමග හෝ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

17. වැඩි විස්තර කොළඹ 2, වොක්ෂෝල් වීදියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (සත්ව පාලන හා සෞඛ්‍ය) තැනගෙන් හෝ නියමිත ඒකක ප්‍රධානීන්ගෙන් විමසිය හැකිය.

අබයරත්න බණ්ඩාරනායක,
නියෝජ්‍ය කෘෂ්කර්ම අධ්‍යක්ෂ,
(සත්ව පාලන හා සෞඛ්‍ය).

1970.1.7 වැනි දින,
තැ.පෙ. 1284, කොළඹ 1,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සත්ව පාලන හා සෞඛ්‍ය කාර්‍යාලයේදීය.

1-677—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### යන්ත්‍රෝපකරණ සැපයීම

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් යන්ත්‍රෝපකරණ සැපයීම පිණිස ප්‍රාදේශික නියෝජිත වරුන්ගෙන් ටැන්ඩර් 1970 පෙබරවාරි මස 23 වෙනි දින ප.ව. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | | සේවය | | ටෙන්ඩර් තැන්පත් මුදල රු. | ශ. |
|---|---|---|---|---|---|
| ඇම්. ටී. 697013 | ... | ජෙනරේටර් (කේ.වී.ඒ. 40) 4 යි | ... | 25 | 0 |
| ඇම්. ටී. 697015 | ... | ජෙනරේටර් (කේ.වී.ඒ. 20) 3 යි | ... | 25 | 0 |

2. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු අංශය) වෙතින් ලබාගත හැකි ආකෘති පත්‍ර මඟින් ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුයි.

3. ටැන්ඩර් පිටපත් තුනක් බැගින් එවිය යුතු අතර සෑම පිටපතක්ම අත්සන් තබා මුද්‍රා තබන ලද කවරයක බහා ඉදිරිපත් කළ යුතුයි. පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති යනුවෙන් ලිපිනය සඳහන් එම මුද්‍රා තබන ලද කවරයේ වම්පස ඉහල කෙළවරෙහි 1970.2.23 වැනි දින වසනු ලබන ජෙනරේටර් සඳහා ටැන්ඩර් '' ටෙන්ඩර් අංකය ඇම්. ටී. 697013/ඇම්. ටී. 697015 '' යන්න ලකුණු කොට එවිය යුතුයි.

4. ටැන්ඩර් පෝර්ම 70.2.22 වෙනි දින පස්වරු 2.30 වන තෙක් නිකුත් කරනු ලැබේ. ඉන්පසුව ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු නොලැබේ.

පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ ඕනෑම කච්චේරියකදී හෝ කොළඹ ලංකා බැංකුවේ, යෝක් වීදි ශාඛාවේ කෘෂිකර්ම අධ්‍යක්ෂකගේ අංක 37 දරණ ගිණුමට හෝ එක් එක් ටෙන්ඩරය සඳහා ඉහත සඳහන් ටෙන්ඩර් තැන්පත් මුදල බැරකළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයට පමණක් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. වැඩි විස්තර පේරාදෙනියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධිකාරි ඉංජිනේරු (ඉංජිනේරු අංශය) වෙතින් ලබාගත හැකිවේ.

ඇල්. ආර්. ඇල්. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙනුවට.

1970.1.8 වෙනි දින,
පේරාදෙනියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
ඉංජිනේරු අංශයේ දී ය.

1—674—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### හිස් ගෝනි විකිණීම

මෙහි පහත උප ලේඛනයේ සඳහන් සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ ගොවිපල් වල හා මධ්‍යස්ථානවල 1969 ඔක්තෝබර් මස 1 වැනිද සිට 1970 සැප්තැම්බර් මස 30 වැනිද තෙක් කාලය ඇතුළතදී එකතුවන හිස් ගෝනි මිළදී ගැනීම සඳහා සීල් තබා එවන ටෙන්ඩර් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.2.26 වැනි දින පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. තෝරා ගන්නා ලද කොන්ත්‍රාත්කරු/කරුවන්ට ඒ බව දන්වූද සිට 1970 සැප්තැම්බර් 30 වැනිද තෙක් කාලය තුළදී එක් එක් මාසයේ 15 වැනිදට පෙර එතෙක් ගොවිපල් වල හා මධ්‍යස්ථානවල එකතුවී ඇති හිස් ගෝනි මිළදී ගෙන ගොවිපලින්/මධ්‍යස්ථානයෙන් ඉවත් කරගත යුතුය.

3. ගෝනි මිළදී ගැනීමේදී තෝරා වෙන් කිරීමට ඉඩ දෙනු නොලැබේ. එහෙත් මුළු ගෝනි තොගයෙන් සියයට දහයක් (10%) අබලන් ගෝනි ලෙස සළකා එම ප්‍රමාණය ටෙන්ඩර් කරන ලද මිළෙන් අඩක් ගෙවා මිළදී ගැනීමට ඉඩ දෙනු ලැබේ.

4. එක් එක් ගොවිපලට වෙන් වෙන් වශයෙන් හෝ ගොවිපල් සියල්ලටම හෝ ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය. එහෙත් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ එක් එක් ගොවිපලට රු. 10 බැගින් මුදල් තැන්පත් කළහොත් පමණි. මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් කොළඹ 2, වැක්සෝල් වීදියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකගෙන් ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය. 1970.2.24 වැනි දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

5. ටෙන්ඩර් පෝර්ම සඳහා මුදල් තැන්පත් කිරීම, ඕනෑම කච්චේරියක හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නැතහොත් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවේ අංක 37 දරණ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමට තැන්පත් කළ හැකිය. ලංකා බැංකුවේ මුදල් තැන්පත් කරන්නේ නම් බැංකුව විසින් සපයන අංක 118 දරණ පොදු ආකෘති පත්‍රය සම්පූර්ණ කර බැංකුවට ඉදිරිපත් කළ යුතුය.

6. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම නිසිලෙස, පැහැදිලිව නිවැරදිව සම්පූර්ණ කර, පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා සීල් තබා ''සභාපති ටෙන්ඩර් මණ්ඩලය, ප්‍රධාන කාර්‍යාලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය'' යන ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් බහාලන කවරයේ උඩ වම් කෙළවරේ ''හිස් ගෝනි මිළදී ගැනීම සඳහා ටෙන්ඩර්'' යන්න පැහැදිලිව ලිවිය යුතුය.

7. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කර එවිය යුතුය. අතින්ම ගෙනවිත් භාර දිය හැකි ටෙන්ඩර් පත්‍රද, මෙහි 4 වැනි ඡෙදයේ සඳහන් පරිදි සකස් කර, පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

8. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී, ටෙන්ඩර්කරුවන්ට උවමනා නම් ඉදිරියේ පෙනී සිටීමට ඉඩ දෙනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම ටෙන්ඩර් භාර ගැනීමට නියමිත අවසන් දින නියමිත වේලාවට පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්‍යාලයේදී සිදු කරනු ඇත.

9. ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවනු ලැබූ ටෙන්ඩර් පත්‍ර ලැබුන බව, ටෙන්ඩර් විවෘත කිරීමට නියමිත දින සිට දින 4ක් ඇතුළතදී යම් ටෙන්ඩර්කරුවකුට නොදැන්වුවහොත් ඒ ගැන නොපමාව ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙන් ලිපියකින් විමසිය යුතුය.

10. ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ලිපිනය පැහැදිලිව ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුය.

11. නියමිත පෝරමයෙහි ලියා නැති, නියමිත කොන්දේසි ඉටුවී නැති කිසිම ටෙන්ඩරයක්, ටෙන්ඩරයක් ලෙස නොසලකන අතර නියමිත දින, නියමිත වේලාවට පසු ලැබෙන ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර, ඒ සම්බන්ධයෙන් යම් වෙනසක් කළහොත්, ඒ තැන්වල ටෙන්ඩර්කරු/ටෙන්ඩර්කරුවන් ගේ කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

13. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවාවූද දේවල මුළු වටිනාකමින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ නමින් තැන්පත් කිරීමට පිළිගනු ලැබූ ටෙන්ඩර්කරුවාට දනුම් දෙන අතර ගිවිසුම් පත්‍රයකට හෝ පොරොන්දු පත්‍රයකට බැඳීමට සිදුවනු ඇත. ගිවිසුම් පත්‍රය හෝ පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. තෝරාගනු ලැබූ ටෙන්ඩර්කරුවාට/කරුවන්ට ඒ බව දන්වා දින 10ක් ඇතුළතදී අවශ්‍ය ඇප මුදල තැන්පත් කිරීම හෝ ගිවිසුම් පත්‍රය හෝ පොරොන්දු පත්‍රයකට බැඳීමට නොහැකි වුවහොත් ඔහුගේ/ඔවුන්ගේ ටෙන්ඩර් මුදල/මුදල් රාජසන්තක කරනුවාත් හැර, ඔහුගේ/ඔවුන්ගේ කොන්ත්‍රාත්තු අවලංගු කර ඔහුගේ/ඔවුන්ගේ නම/නම් රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලැයිස්තුවටද ඇතුළත් කරනු ඇත.

14. ගිවිසුම් පත්‍රයට හෝ පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දර වල වටිනාකම පත් කර ගත් කොන්ත්‍රාත්කරු/කරුවන් විසින් දැරිය යුතු අතර එම ගිවිසුමට හෝ පොරොන්දු පත්‍රයට කොන්ත්‍රාත්කරු/කරුවන් වෙනුවෙන් සාක්ෂි වලට අත්සන් තැබීම සඳහා සාක්ෂිකරුවන් දෙදෙනෙකු තමාගේ වියදමින් ඉදිරිපත් කළ යුතුය. මෙම සාක්ෂිකරුවන්, කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් මැනවැයි සෑහීමකට පත්විය යුතුය.

15. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර හෝ ප්‍රතික්ෂේප කිරීමටත් කිසියම් ටෙන්ඩර් පත්‍රයකින් කොටසක් පිළිගැනීමටත් කෘෂිකර්ම අධ්‍යක්ෂට බලය ඇත.

16. පත් කරනු ලැබූ කොන්ත්‍රාත්කරු/කොන්ත්‍රාත්කරුවන්, ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවා වූද වැඩය කිරීම සඳහා යොදගත යුත්තේ ලාංකික කම්කරුවන් පමණි. මෙහි ලාංකික යන්නෙහි අදහස පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් ලංකාවේ පුරවැසියෙකු වීම යන්නයි.

17. 1934 අංක 19 දරණ කම්කරුවන්ගේ වන්දි ආඥපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරුවා විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුය.

18. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු සියළුම දැන්වීම් ඔහුගේ අතට භාර දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයකට යැවුවහොත් හෝ ඔහුගේ අතටම භාර දුන් ලෙස සලකනු ලැබේ.

19. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවකු කොන්ත්‍රාත්කරුවා වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ බලය ආණ්ඩුව වෙත තබා ගනු ලැබේ.

20. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම් ඇතුලත් ව හෝ තමාට සෑහෙ යයි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතැන විරුද්ධවන කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

21. අවශ්‍ය නම් කලින් නියම කරගත් දිනක ගොවිපල් හා ආයතනයන්හි භාරකරුවන්ගේ අවසරය ඇතිව ඒ ඒ ගොවිපල්වල හා ආයතන වල හිස් ගෝනි පරීක්ෂා කර බැලිය හැක.

22. වැඩි විස්තර කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, සත්ව පාලන හා සෞඛ්‍ය පිළිබඳ නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තැනගෙන් හෝ ඒ ඒ ගොවිපල් හා ස්ථාන භාර නිළධාරිගෙන් ලබා ගත හැකිය.

අබේරත්න බණ්ඩාරනායක,
නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ,
(සත්ව පාලන හා සෞඛ්‍ය).

1970.1.12 වැනි දින,
කොළඹ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ,
සත්ව පාලන හා සෞඛ්‍ය අංශයේ දීය.

## උපලේඛනය

| | ගොවිපල | මාසයකට ගත හැකි ගෝනි ප්‍රමාණය දළ වශයෙන් | | කිට්ටුම දුම්රියපල |
|---|---|---|---|---|
| 1. | බෝපත්තලාව සත්ව ගොවිපල | 1,000 | ... | තලවකැලේ |
| 2. | නවසීලන්ත සත්ව ගොවිපල, අඹේවෙල | 850 | ... | අඹේවෙල |
| 3. | රිදියගම සත්ව ගොවිපල ... | 850 | ... | අම්බලන්තොට |
| 4. | පොළොන්නරුව සත්ව ගොවිපල | 1,000 | ... | පොළොන්නරුව |
| 5. | අඹේවෙල සත්ව ගොවිපල ... | 1,000 | ... | අඹේවෙල |
| 6. | ඩයගම සත්ව ගොවිපල ... | 100 | ... | තලවකැලේ |
| 7. | වැලිසර සත්ව ගොවිපල ... | 500 | ... | රාගම |
| 8. | උඩුගොඩ සත්ව ගොවිපල ... | 200 | ... | පොල්ගහවෙල |
| 9. | කන්දකඩුව සත්ව ගොවිපල ... | 1,000 | ... | වැලිකන්ද |
| 10. | කුණ්ඩසාලේ කුකුල් මධ්‍ය ස්ථානය | 100 | ... | මහනුවර |
| 11. | කොටුකච්චිය සත්ව ගොවිපල ... | 100 | ... | පුත්තලම |
| 12. | කරගොඩ-උයන්ගොඩ සත්ව ගොවිපල | 150 | ... | මාතර |
| 13. | වීරවිල සත්ව ගොවිපල ... | 100 | ... | තිස්සමහාරාමය |
| 14. | නිකවැරටිය සත්ව ගොවිපල ... | 60 | ... | මාහෝ |
| 15. | මාරවිල සත්ව ගොවිපල ... | 75 | ... | නාත්තන්ඩිය |
| 16. | කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍ය ස්ථානය | 50 | ... | මහනුවර |
| 17. | යාපනය තින්නවැලි කෘතිම සිංචන මධ්‍යස්ථානය | 50 | ... | යාපනය |
| 18. | පශු වෛද්‍ය කායශාලය, කෑගල්ල | 50 | ... | පොල්ගහවෙල |

1–669—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### අනුරාධපුර කෘෂිකර්ම ව්‍යාප්ති මධ්‍යස්ථානය සහ ගම්පොල පශු වෛද්‍ය බෙහෙත් ශාලා මධ්‍යස්ථානය සෑදීම

ඉහතින් සඳහන් ගොඩනැගිලි තැනීම සඳහා ටෙන්ඩර් පත් පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970.3.2 වෙනි දින පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ. ගොඩනැගිලි දෙකට වෙන වෙනම ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අතර, ගොඩනැගිලි දෙක වෙනුවෙන්ම ටෙන්ඩර් කිරීමට ටෙන්ඩර් කරුවන්ට අවකාශ ඇත.

2. කොළඹ—5, නාරාහේන්පිට, පළතුරු කම්හල පාරේ, සිවිල් ඉංජිනේරු කාර්යාලයේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, උපදේශක ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකි පෝරම පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත්‍ර පිළියෙලකොට ඉදිරිපත් කළ යුතුය. ඔහුගෙන් රූප සටහන්, විශේෂ විස්තර හා වෙනත් තොරතුරුද ලබා ගත හැකිය.

3. ටෙන්ඩර්කරුවන් රු. 30,000 කට නොඅඩු ගොඩනැගිලි ක්‍රියාත්මක කිරීම සඳහා රජයේ දෙපාර්තමේන්තුවක ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් විය යුතුය.

4. පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ විට 1970.2.19 වැනි දින පස්වරු 4 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ:—

(අ) 3 වැනි ඡේදයේ සඳහන් ලියාපදිංචි කිරීමේ ලියවිල්ලක්.

(ආ) රුපියල් 50 ටෙන්ඩර් තැන්පත් මුදලේ කුවිතාන්සියක් (සෑම ගොඩනැගිල්ලකටම) .

5. ටෙන්ඩර් තැන්පත් මුදල පේරාදෙණියේ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක හෝ කෘෂිකර්ම අධ්‍යක්ෂවරයාගේ අංක 37 දරණ ගිනුමට බැර කරමින් කොළඹ යෝක් වීදියේ ලංකා බැංකු ශාඛාවෙහි තැන්පත් කළ යුතුය.

ඒ. සී. පෙරේරා,
කෘෂිකර්ම අධ්‍යක්ෂක වෙනුවට.

1970.1.20 වැනි දින,
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව,
සිවිල් ඉංජිනේරු කාර්යාලය,
පලතුරු කම්හල පාර,
නාරාහේන්පිට.
කොළඹ—5.

1–500—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් කොන්දේසි

සේවයට සුදුසු 2 ශ්‍රී කාණ්ඩයේ පෝඩ් පෙයාර්ලේන් කන්ට්‍රිසිඩැන් වර්ගයේ කාර් එකක් මිලදී ගෙන යාම සඳහා ටෙන්ඩර් මෙහි කැඳවනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම 70.2.16 වැනි දින පස්වරු 3 ට අවසන් වේ.

2. ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්ත විය යුතු අතර ඒවා සීල් තුබූ කවරයක බහා එම ලියුම් කවරයේ මුදුනේ වම් කෙළවරේ " කාර් එකක් මිලදී ගෙන යාම සඳහා ටෙන්ඩර් " යන්න ලියා 70.2.16 දින ප. ව. 3 ඉක්මෙන්නට ප්‍රථම, කොළඹ 7, ඇල්බට් චන්ද්‍ර වංකයේ අංක 6 දරණ ස්ථානයේ පිහිටි ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත් ලියා පදිංචි කළ තැපෑලෙන් නො එවන ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත් කවරයක බහා සීල් තබා එම කවරයේ මුදුනේ වම් කෙලවරේ අවශ්‍ය විස්තර සඳහන් කොට වම් කෙලවරේ පහල ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය ලියා ඔවුන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් ඒ සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

3. කොළඹ 7, අංක 6 ඇල්බට් චන්ද්‍රවංකයේ පිහිටි ජනලේඛන හා සංඛ්‍යාලේඛන කාර්යාලයෙන් 70.2.15 දින දහවල් 12 දක්වා ලබා ගත හැකි පෝරමවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

4. කොළඹ 7, අංක 6 ඇල්බට් චන්ද්‍රවංකයේ පිහිටි ජනලේඛන හා සංඛ්‍යාලේඛන කාර්යාලයේ දී අධ්‍යක්ෂ විසින් 70.2.16 දින සවස 3.15 ට ටෙන්ඩර් විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම්, ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එම ස්ථානයේ සිටීමට අවසර දෙනු ලැබේ. ඉහත සඳහන් කර තිබෙන ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන දිනයේ එම වේලාවට ටෙන්ඩර් විවෘත කරනු ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා ටෙන්ඩර්කරුවන්ගේ නම සහ ඉදිරිපත් කර ඇති ගාස්තු ප්‍රමාණයන් එම ස්ථානයේ සිටින ටෙන්ඩර් කරුවන්ට ඇසෙන සේ කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට කිසියම් ටෙන්ඩර් පත්‍රයක දෙවෙනි පිටපත පරීක්ෂා කර බැලීමට අවශ්‍ය නම්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ගේ අවසරය ඇතිව එසේ කිරීමට අවසර දෙනු ලැබේ.

5. ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කරන මිල ගණන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් වූ දින සිට සති 6 ක් දක්වා, ස්ථිරව හා වලංගුව පැවතිය යුතුය. කාර් ටෙන්ඩර් පත්‍ර අත්සන් කළ යුතු අතර සියලුම වෙනස් කිරීම් හා මකා දැමීම සහතික කළ යුතුවේ. ටෙන්ඩර් කොන්දේසිවල, පිටපත් ටෙන්ඩර්කරු විසින් යථා පරිදි අත්සන් කර ටෙන්ඩරයට ඇමිනිය යුතුය.

6. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීම සඳහා ජනලේඛන හා සංඛ්‍යා ලේඛන අධ්‍යක්ෂ වෙත කොළඹ 7, ඇල්බට් චන්ද්‍රවංකයේ අංක 6 දරන ස්ථානයේ පිහිටි ඔහුගේ කාර්යාලයේ දී රු. 250 ක මුදලක් තැන්පත් කිරීමෙන් ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි. තමාගේ ටෙන්ඩරය පිළිගත් බව දැක්වෙන ලිඛිත නිවේදනය ලියා පදිංචි කළ තැපෑලෙන් ලත් දින සිට දින 10 ක් ඇතුළත දී ටෙන්ඩර කර ඇති මිල ගෙවා කාර් එක ඉවත් කර ගැනීමට ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කළ හොත් හෝ ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනවාත් හැර ඉන්පසු රජයේ කිසිම කොන්ත්‍රාත්තුවක් ඇති කර ගැනීමට නොහැකි වන සේ ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුලත් කරනු ලැබේ. ටෙන්ඩරය පිළිගත් බව දැක්වෙන නිවේදනය ටෙන්ඩර්කරු විසින් සපයා ඇති ලිපිනයට තැපෑලෙන් යවා ඇතහොත් හෝ එම ලිපිනයට භාර දුනහොත් එය ටෙන්ඩර්කරුට ලැබුනා සේ සලකනු ලැබේ.

7. කොළඹ 7, අංක 6 ඇල්බට් චන්ද්‍රවංක ස්ථානයේ පිහිටි ජන ලේඛන හා සංඛ්‍යාලේඛන කාර්යාලයේ අධ්‍යක්ෂගෙන් කලින් පිළියෙල කර ගැනීමෙන් පසු සතියේ වැඩ කරන ඕනෑම දිනයක සාමාන්‍ය වැඩ කරන කාලය ඇතුලත ඉහත කී කාර් එක පරීක්ෂා කර බැලීමට පුළුවන.

8. කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම ප්‍රතික්ෂේප කිරීම සහ ටෙන්ඩරයක ඕනෑම කොටසක් භාර ගැනීම පිළිබඳ සම්පූර්ණ අයිතිය ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ සතුය.

එල්. බී. රාජකරුණා,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1970 ජනවාරි මස 17 දින,
කොළඹ 7, තැ. පෙ. 563,
අංක 6, ඇල්බට් චන්ද්‍රවංකය,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේදීය.

89—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## සුළු වාරිකර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීම

මෙම කාර්යාලයේ, පළාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

| වාරිමාර්ගයේ නම | | ගම්වගා නිලධාරි කොට්ඨාශය |
|---|---|---|
| 1. සියඹලගස්වෙල-කාක්කාපල්ලිය ඇල වැඩිදියුණු කිරීම | ... | හලාවත |
| 2. දම්පිටිගම ඇල වැඩිදියුණු කිරීම | ... | හලාවත |
| 3. මරදන්කුලම ඇල වැඩිදියුණු කිරීම | ... | හලාවත |
| 4. පොතුවැව බැම්ම වැඩිදියුණු කිරීම | ... | හලාවත |
| 5. පාලුමරදන්කුලම වැව වැඩිදියුණු කිරීම | ... | හලාවත |
| 6. සෙම්බුකුලිය වැව වැඩිදියුණු කිරීම | ... | ආණමඩුව (කු. ව. ප.) |
| 7. මහකුඹුක්කඩවල වැව හොරොව්ව සහ තැලවිල්ල අලුත් වැඩියා කිරීම | ... | ආණමඩුව (කු. ව. ප.) |
| 8. මහ ආඬිගම වැව හොරොව්ව වැඩිදියුණු කිරීම | ... | ආණමඩුව (කු. ව. ප.) |
| 9. රඹාවැව වැව ප්‍රතිසංස්කරණය කිරීම | ... | ආණමඩුව (කු. ව. ප.) |
| 10. ඉහල අමුණුගම වැව වැඩිදියුණු කිරීම | ... | ආණමඩුව (කු. ව. ප.) |
| 11. පෙරියකඩවල ඇල වල් වැඩිදියුණු කිරීම | ... | පුත්තලම |
| 12. තම්මැන්නාකුලම වැව වැඩිදියුණු කිරීම | ... | පුත්තලම |
| 13. කලියවඩන ඇල වැඩිදියුණු කිරීම | ... | දන්කොටුව |
| 14. වෙන්නප්පුව මැද ඇල වැඩිදියුණු කිරීම | ... | දන්කොටුව. |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසිවලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1970 පෙබරවාරි මස 15 දින දවල් 12 දක්වා හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර්කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිල ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සැමෙකක්ම, ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහා එවන ලියුම් කවරයේ උඩ වම් කෙළවරේ "..................සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය " යනුවෙන් සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර, 1970 පෙබරවාරි මස 22 දින දවල් 12 ට පෙර හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන සුරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති " ටෙන්ඩර් පෙට්ටියට " දැමිය යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර් කරුට ඒ බව හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද ටෙන්ඩර් භාරගන්නා වූ නිලධාරිතැන විසින් හෝ ලියවිල්ලකින් දැනුම් දෙනු ඇත. මේ දැනුම්දීම නිකුත් කළ දින සිට, දශ දිනක් ඇතුලත දී එම ටෙන්ඩර්කරු විසින් හලාවත-පුත්තලම් දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන සමග ඒ සම්බන්ධයෙන් ගිවිසුමකට ඇතුලත් විය යුතුය. නියමිත පරිදි හා සතුටුදායක ලෙස වැඩය නිම කරන වගට

ඇපයක් වශයෙන් ටෙන්ඩරයේ සඳහන් මුදලින් සියයට 5 ක් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළ යුතුය. ගිවිසුම අත්සන් කළ පසු සියළුම ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ඇත.

6. පිළිගත් ටෙන්ඩරය අනුව ගිවිසුමකට ඇතුලත් වන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට දැන්වීමෙන් පසුව ද, එසේ කිරීමට ඔහු අසමත් වුවොත් ඔහුගේ ටෙන්ඩර් ඇප මුදල රාජසන්තක කොට ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයට ඇතුළත් කිරීමට ක්‍රියා කරනු ඇත.

7. කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ ඕනෑම ටෙන්ඩර් පත්‍රයක ඕනෑම කොටසක් පිළිගැනීමේ බලය රජයට ඇත.

8. හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ හෝ ඔහු විසින් බලය පවරන ලද නියෝජිතයාගේ හෝ අවසරයක් නොමැතිව කොන්ත්‍රාත්තුව අන් කෙනෙකුට නොපැවරිය යුතුය.

9. රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ නාම ලේඛනයට තනිව හෝ වෙනත් පුද්ගලයෙකුගේ නමත් සමඟ නම ඇතුලත් වී ඇති කිසිවකු සමඟ හෝ තමාට ප්‍රමාණවත් යයි හැඟෙන හේතුන් උඩ, හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විරුද්ධ වන කවරෙකු සමඟ හෝ ගිවිසුම කට නොබැඳෙනු ඇත.

10. ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය දක්වා ඕනෑම දිනයක කාර්යාලීය වේලාවන් තුලදී සැලසුම් පරීක්ෂා කර බැලීමට හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් වැඩ විස්තර පත්‍රිකාවෙහි ඇතුලත් කළයුතු විස්තර ප්‍රමාණවත් ලෙස සඳහන් නොකිරීම නිසා ටෙන්ඩර් පත්‍රිකාවල ඇතිවන වැරදි ගැන දෙපාර්තමේන්තුව වග නොකියනු ඇත. යෝජිත ස්ථානයත්, සැලසුම් ආදියත් පරීක්ෂා කර බැලීමෙන් ද, වෙනත් අවශ්‍ය වැඩි විස්තර ගැන කාර්යාලීය වේලාවන් තුලදී හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් විමසීමෙන් ද, ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය, අවශ්‍ය සේවය කුමක්දැයි හොඳින් වටහා ගත යුතුය.

11. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණය. "ලාංකික" යනුවෙන් අදහස් වන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ලංකාවේ පුරවැසියන් වූ අය යි.

12. තෝරා ගනු ලැබූ කොන්ත්‍රාත්කරු ලංකාණ්ඩුව සඳහා හෝ ලංකාණ්ඩුව වෙනුවෙන් පෙනී සිටින හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් සමඟ ගිවිසුමකට ඇතුළත් විය යුතුය. "ගොවිජන සේවා සහකාර කොමසාරිස්" යනුවෙන් හැඳින් වෙන්නේ දැනට ලංකාණ්ඩුව යටතේ එම තනතුරු දරණ නිලධාරි තැනය. ගිවිසුම් පත්‍රයේ අඩංගු වියයුතු මුද්දර කොන්ත්‍රාත් කරු විසින් සැපයිය යුතුය.

13. හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැන විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු විසින් හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන වෙනත් නිලධාරියකු විසින් 1970 පෙබරවාරි මස 23 දින පෙ. ව. 9.30 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර්කරුවන්ගේ දැන ගැනීම සඳහා, ටෙන්ඩර් විවෘත කරන නිලධාරි තැන විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා ඒවයේ සම්පූර්ණ මිළ ගණන් කියවනු ලැබේ. වැඩි විස්තර කියවීමක් හෝ දැන්වීමක් නොකරනු ඇත. ඕනෑම ටෙන්ඩර්කරුවකුට මුළු ගණන් පරීක්ෂා කිරීමට වුවමනා නම් මුල් ටෙන්ඩර් පත්‍රවල අවසාන පිටුව බැලීමෙන් එසේ කළ හැක.

14. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ සියළුම මිළ ගණන් ටෙන්ඩර් විවෘත කළ දින පටන් මසක් ගතවන තුරු වලංගුව තැබිය යුතුය.

ලෙස්ලි ජේපාන්සේකා ගුණසේකර,
ගොවිජන සේවා සහකාර කොමසාරිස්,
හලාවත-පුත්තලම දිස්ත්‍රික්කය.

හලාවත-පුත්තලම දිස්ත්‍රික්කයේ,
ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලය,
1970 ජනවාරි මස 13 දින දීය.

1–681—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

දුම්රිය දෙපාර්තමේන්තුවට රාත්තල් 80 සහ රාත්තල් 88 රේල් පිලි සැපයීම පිළිබඳව 1970. 1. 9 දින අංක 14,888 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනය සම්බන්ධවයි. ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1970 මාර්තු මස 9 වෙනි දින පෙ. ව. 11 සේ වෙනස් කර ඇත. 1970.3.8 දින දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොල නිකුත් කරනු ඇත. අනෙක් කොන්දේසිවල වෙනසක් කර නැත.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1970 ජනවාරි 20 වෙනි දින,
කොළඹ.

1–494—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

මරදානේ තැපැල් සහ විදුලි සංදේශ ගබඩා භූමියෙහි ඇති, විදුලි සංදේශ ප්‍රවාහන අංශයට අයත් සේවයට නුසුදුසු මෝටර් වාහන හයක් (6) විකිණීම සඳහා, කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ පස්වන මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයේ ගැණුම්පත් මණ්ඩල සභාපති විසින් 1970 පෙබරවාරි 24 වෙනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ පස්වන මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝර්ම වලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂාකර බැලීමටද, අවශ්‍ය විස්තර දැන ගැනීමටද පුලුවන.

3. තැපැල් කාර්යාලයක හෝ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත හෝ ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1970 පෙබරවාරි 19 වෙනි දින ප. ව. 3 වන තෙක් බලාපොරොත්තු ටෙන්ඩර්කරුවනට, ටෙන්ඩර් ඉල්ලුම් පත් ලබා ගත හැකිවේ.

වී. අලගරත්නම්,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
ලෝටස් පාර, කොළඹ 1.

1–522—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු මෝටර් රථයක් විකිණීම සඳහා ටෙන්ඩර්

1970. 1. 2 දින අංක 14,887 දරණ රජයේ ගැසට් පත්‍රයේ පලවුණු, අයි. සී. 1898 (ඔස්ටින් ඒ. 6 බවුසර්-ලොරිය ඇක්ජම සහිතව) විකිණීම සඳහා මගේ දැන්වීම සම්බන්ධවයි.

ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීම හා ටෙන්ඩර් විවෘත කිරීම පහත සඳහන් පරිදි දීර්ඝ කර ඇති බව දන්වනු ලැබේ.

1. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීම 1970.2.18 දින දවල් 12 දක්වා

2. ටෙන්ඩර් භාර ගැනීම 1970.2.20 දින පෙ. ව. 11 දක්වා

3. ටෙන්ඩර් විවෘත කිරීම 1970.2.20 දින පෙ. ව. 11 ට.

පී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

1–675—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පදවියේ දිස්ත්‍රික් ඉඩම් නිලධාරි ආයතනයට ජෙනරේටරයක් සැපයීම හා ස්ථාපනය කිරීම

ඉහත සඳහන් සේවය සඳහා ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් 1970. 3. 5 වන දින පෙරවරු 11 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර්කරු විසින් සැපයීම කළ යුත්තේ (ඒ) තිබෙන තොගයෙන්, (බී) ආනයනය කරන තොගයෙන්, හෝ (සී) "විවිගිස" ගෙවා ආනයනය කිරීමටත් ය.

2. 1970. 3. 4 වෙනි දින දහවල් 12 තෙක් ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමග ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලයේ හෝ කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකු කාර්යාලයේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 දරණ ගිණුමට හෝ කොළඹින් බැහැර කච්චේරියක හෝ රු. 25 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට මත්තෙන් ඉදිරිපත් කළ යුතුයි.

3. සියලු ටෙන්ඩර් කවරයන් හි වම් පස ඉහළ කෙළවරේ "පදවියේ දිස්ත්‍රික් ඉඩම් නිලධාරි ආයතනයට ජෙනරේටරයක් සැපයීම සහ ස්ථාපනය කිරීම සඳහා ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කොට ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1, යන ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් පස පහළ කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුයි. ටෙන්ඩර් ලියාපදිංචි තැපෑලෙන් හෝ පුද්ගලික නියෝජිතයකුගේ මාර්ගයෙන් හෝ තමා විසින් හෝ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනට භාර දිය යුතුයි.

4. ටෙන්ඩර් පෝර්ම ආදිය ලබාගත් පසු ටෙන්ඩර් කිරීමට නොහැකි වූවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල්, ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනයට හා නියමිත වේලාවට පෙර ඉදිරිපත් කළහොත් පමණක් ආපසු ගෙවනු ලැබේ.

5. ටෙන්ඩර් ස්ථිර වූවාක් මෙන්ම කිසියම් වෙනස් කිරීමකට අදාල නොවිය යුත්තේ ය. ටෙන්ඩර් සලකා බැලීමට ඇති හෙයින් විවෘත කළ දින සිට දින 60 ක් යන තෙක් ඒවා ආපසු ගෙන්වා ගත නොහැකිය.

6. ටෙන්ඩර්කරුවන් සැපයීම පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඉදිරිපත් කළ යුතුයි. පිළිගත් විස්තරයට යම්කිසි වෙනස් වීමක් වෙතොත් ඒ බැව් සඳහන් කළ යුතුය.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරු සැපයීම පැහැර හැරියොත් තැන්පත් මුදල රාජසන්තක වනවා පමණක් නොව, රජයේ කොන්දේසි කඩ කරන කොන්ත්‍රාත්කරුවන්ගේ ලේඛනයට ඔහුගේ නම ද ඇතුළත් වන්නේ ය.

8. කොළඹ, එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදී 1970.3.5 වැනි දින පෙරවරු 11 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර්කරුවන්ට ඒ අවස්ථාවේදී පෙනී සිටිය හැක.

9. කිසියම් ප්‍රශ්න කිරීමක් නොමැතිව ටෙන්ඩරයක කොටසක් හෝ සම්පූර්ණයෙන් ම හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ ටෙන්ඩරයේ කොටසක් පිළිගැනීමේ අයිතිය රජය සතුය.

10. වැඩි විස්තර සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරුතැනගෙන් විමසන්න.

සී. රත්නසිංහම්,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු කාර්යාලය,
1970. 1. 14.
සීපී/2/308.

1–676—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු කාර්යාලයීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතැන විසින් අඟල් 9-18 සක්ක ගල් කියුබ් දෙසිය අසූ දෙකක් (කියුබ් 282) පුත්තලමේදී සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 25 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉන්ජිනේරු තැන වෙත 1970 පෙබරවාරි 13 සිකුරාදා පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්ම ද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉන්ජිනේරු තැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 370,
කොළඹ,
1970 ජනවාරි 19 වැනි දින.

1–520—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරු කාර්යාලයීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතැන විසින් බොරළු කියුබ් 860 ක් පුත්තලමේදී සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1970 පෙබරවාරි මස 27 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් භාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රුපියල් 25 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද කොළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබා ගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉන්ජිනේරු තැන වෙත 1970 පෙබරවාරි 13 සිකුරාදා පස්වරු 4 ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය.

4. මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්ම ද කොළඹ ඩී. ආර්. විජයවර්ධන මාවතේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉන්ජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

ජේ. පෝල් සේනාරත්න,
ප්‍රධාන ඉන්ජිනේරු තැන,
ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව.

තැ. පෙ. 370,
කොළඹ,
1970 ජනවාරි 19 වැනි දින.

1–519—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටි පාසැල්වලට "ඇදිහාස" කිරි විස්කෝතු ප්‍රවාහනය කිරීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි—1969-70

වර්ෂ 1970 මාර්තු මස 1 වැනි දින සිට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා කාලය තුළ. අඟල් 19 × 11 × 9 ප්‍රමාණයේ කාඩ්බෝඩ් පෙට්ටිවල ආසන්න වශයෙන් රාත්තල් 20 බැගින් අසුරා ඇති කිරි විස්කෝතු පෙට්ටි ප්‍රවාහනය කිරීම සඳහා සීල් තබන ලද පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත් 1970 පෙබරවාරි මස 20 වැනි දින පෙ. ව. 10 දක්වා රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාර ගනු ලැබේ.

2. පහත සඳහන් සේවාව සඳහා ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුයි :—

(1). ආහාර පාලක දෙපාර්තමේන්තුවේ, ඕපනායක බෙදා හැරීමේ ගබඩාවේ සිට, බලන්ගොඩ උතුර සහ බලන්ගොඩ දකුණ අධ්‍යාපන මණ්ඩලවලට අයත් පාසැල්වලටය.

3. ටෙන්ඩර් පත්‍ර රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රවල ඉදිරිපත් කළ යුතුය. රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ රු. 100 ක් තැන්පත් කර ඊට රිසිට් පතක් ඉදිරිපත් කරන ඉල්ලුම්කරුවන්ට 1970

පෙබරවාරි මස 19 වැනි දින ප. ව. 2 වන තෙක් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ. අනුමත කරන ලද සමිති විසින් මුදලක් තැන්පත් කිරීම අනවශ්‍යය ය.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර ටෙන්ඩර් භාරදීමට බලාපොරොත්තු වන අය තමා සතුව රු. 10,000ට නොඅඩු වටිනාකමක් ඇති නිශ්චල දේපළ ඇති බවට තම ප්‍රාදේශයේ ආදායම් පාලක නිලධාරීන්ගෙන් මෑතකදී ලබා ගත් සහතිකයක් ද, මේ සේවාව සඳහා ඉල්ලුම්කරු නමින් ලියාපදිංචි කරන ලද මේ වර්ෂය සට වලංගු බලපත්‍රය ඇති එක් ලොරියක්වත් ඇති බවට සාක්ෂි රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

5. අනුමත කරන ලද සමුපකාර සමිති, ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමුපකාර සමිති විසින් ටෙන්ඩර් පත් ලබා ගැනීමට පෙර එකී සමිතියට මෙම සේවාව ඉටු කිරීමට හැකියාවක් ඇති ලොරි සේවයක් ඇති බවට සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්ගෙන් හෝ ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂගෙන් හෝ කම්කරු කොමසාරිස්ගෙන් හෝ (ඒ ඒ සමිතිවලට අදාළ පරිදි) ලබා ගත් සහතිකයක් රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීමට හෝ එහි කොටසක් පමණක් භාර ගැනීමට හෝ බලය ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතු ය.

7. 1970 පෙබරවාරි මස 20 වැනි දින පෙ. ව. 11 ට රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

8. මේ සම්බන්ධයෙන් තවත් අවශ්‍ය විස්තර වෙතොත් රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබා ගත හැක.

එස්. පී. ජයසූරිය,
රත්නපුර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 ජනවාරි මස 18 වැනි දින,
රත්නපුර,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ය.

1–771—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—ටෙන්ඩර් කැඳවීම්

### නිවැරදි කිරීම

1970 ජනවාරි මස 16 වැනි දින දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ගැසට් නිවේදනයේ 2 වැනි ඡේදයේ අංක 1 වැඩය (මොණරාගල අධ්‍යාපන කාර්යාලයේ විවාහක ලිපිකරු නිවාසය තැනීම) සඳහා ලියාපදිංචි වී සිටිය යුතු කොන්ත්‍රාත් මුදල, රු. 40,(00 නොව රු. 45,000 බව කරුණාවෙන් සලකන්න.

පී. කාරියවසම්,
ප්‍රධාන අධ්‍යාපන නිලධාරී,
මොණරාගල.

1970 ජනවාරි මස 18 වැනි දින,
අධ්‍යාපන කාර්යාලයේ දීය,
මොණරාගල.

1–772—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 පෙබරවාරි මස 20 වැනි දින පෙරවරු 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | | වැඩයෙහි ස්වභාවය |
|---|---|---|
| (1) කු/නාකොළගනේ වි. | ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (2) කු/අලියාවැටුන වැව වි. | ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (3) කු/නෙලුම්පත් වැව වි. | ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (4) කු/පාලුවකොළණි වි. | ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (5) කු/පරගහදෙනිය මු. වි. | ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (6) කු/විකාදෙනිගම වි. | ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (7) කු/මෝරුගම වි. | ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (8) කු/මාහෝ ම. ළ. වි. | ... | කෘෂිකර්ම විද්‍යාගාරය . |

සංලක්ෂ්‍යය : කු=කුරුණෑගල දිස්ත්‍රික්කය .

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් අංක 1 සිට 7 දක්වා රු. 20,000 හෝ ඊට වැඩි ගණනකට අංක 8 සඳහා පමණක් රු. 15,000 හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 පෙබරවාරි මස 19 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධ සියලු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදිය ද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නො එවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ පාලන සහකාර වෙත භාරදිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

5. 1970 පෙබරවාරි මස 20 වැනි දා පෙරවරු 10.30ට කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගත වන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 66. 9. 30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඩී. එස්. කළුගම්පිටිය,
කුරුණෑගල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 ජනවාරි මස 16 දින,
කුරුණෑගල අධ්‍යාපන කාර්යාලයේ දී ය.

1–680—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව—බණ්ඩාරවෙල

1970 පෙබරවාරි මස 20 වන දින පෙ. ව. 10.30 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| (1) බ/හපුතලේ මහා විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| (2) බ/හපුතලේ දෙමළ විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| (3) බ/කොස්ලන්ද දෙමළ විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| (4) බ/විත්තෙකැලේ පාසැල ... | පාසැල් ගොඩනැගිල්ල තැනීම. |
| (5) බ/බදුල්ල කණිෂ්ඨ කාර්මික විද්‍යාලය ... | අළුත්වැඩියාව. |
| (6) බ/ගල්බොක්ක යෝජිත පාසැල ... | වැසිකිලි තැනීම. |
| (7) බ/කන්දේගම පාසැල ... | වැසිකිලි තැනීම. |

සංලක්ෂ්‍යය : බ = බදුල්ල දිස්ත්‍රික්කය.

අවශ්‍ය ලියාපදිංචිය—

1 සිට 4 දක්වා රු : 20,000 හෝ ඊට වැඩි,
5 සිට 7 දක්වා රු. 5,000ට වැඩි.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයයේ හෝ බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් ඉහත සඳහන් පරිදි හා ඊට වැඩි ගණන කට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 පෙබරවාරි මස 19 වැනි දා දවල් 12 දක්වා ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 ට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චෙක්පත්, මුදල් ඇනවුම්, තැපැල් ඇනවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබාගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සිය නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි සහ 3 වැනි ඡේදවල සඳහන් පරිදි බණ්ඩාරවෙල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුයි. මොහුගෙන් වැඩය සම්බන්ධව සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි තැපෑලෙන් බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේ පාලන නිලධාරී හෝ ප්‍රධාන ලිපිකාර වෙත භාර දිය යුතුයි. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුයි.

5. 1970 පෙබරවාරි මස 20 වැනි දා පෙරවරු 10.30 ට බණ්ඩාරවෙල අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාරගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවනතුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තර වේනොත් බණ්ඩාරවෙල ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂාකර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 1966.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව, කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

පී. ඊ. ජී. මෙන්ඩිස්,
ඌව ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 ජනවාරි මස 17 වන දින,
බණ්ඩාරවෙල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

1–789—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 පෙබරවාරි මස 20 වැනි සිකුරාදා පෙ. ව. 10.30 වනතෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර නුවරඑළිය අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් භාරගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩයේ ස්වභාවය |
|---|---|
| (1) බ/වැලිමඩගම විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (2) බ/බොරලන්ද විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (3) බ/බොරගස්කැටිය විද්‍යාලය | පාසැල් ගොඩනැගිල්ල. |
| (4) බ/මැදවෙල මහා විද්‍යාලය... | පාසැල් ගොඩනැගිල්ල. |
| (5) බ/බුස්දුල්ල විද්‍යාලය ... | පාසැල් ගොඩනැගිල්ල. |
| (6) නු/මාගස්තොට විද්‍යාලය ... | අළුත් වැඩියාව. |

අංක 1—සංලක්ෂ්‍යය :

බ = බදුල්ල දිස්ත්‍රික්කය
නු = නුවරඑළිය දිස්ත්‍රික්කය

අංක 2—අවශ්‍ය ලියාපදිංචි කිරීම් :

අංක 1 පමණක් රු. 30,000 හෝ ඊට වැඩි.
අංක 2 සිට 5 දක්වා රු. 25,000 හෝ ඊට වැඩි.
අංක 6 පමණක් රු. 10,000 හෝ ඊට වැඩි.

2. කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කාර්යාලයේ රු. 100 ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන්, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ හෝ ගොඩනැගිලි වැඩ සඳහා ඉහත අංක 2 හි සඳහන් ගණනට ලියාපදිංචිවී ඇති කොන්ත්‍රාත්කරුවනට 1970 පෙබරවාරි මස 19 වැනි බ්‍රහස්පතින්දා දහවල් 12 දක්වා ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙති.) චෙක්පත්, මුදල් ඇණවුම්, තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාරදීමේ කුවිතාන්සිය කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ ලබා ගත හැක. මුදල් භාරදීමේ කුවිතාන්සිය නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්ෂි ඉදිරිපත් කරන අයට පමණක්ය.

3. දෙවැනි අංකයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයන්ට, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ හෝ රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවී ඇති අනුමත සමිතිවලටද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදලක් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි අංකයේ සඳහා මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. පූර්වෝක්ත 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතුය. මොහුගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලාගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත් ලියාපදිංචි කළ තැපෑලෙන් නුවරඑළියේ අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නාම හා ලිපිනය පැහැදිලිව ලියා ටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයකු විසින් පුද්ගලිකව නුවරඑළිය අධ්‍යාපන කාර්යාලයේ කාර්යාල සහකාර වෙත භාරදිය යුතුය. එසේ භාරදුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

5. 1970 පෙබරවාරි මස 20 වැනි සිකුරාදා පෙ. ව. 10.30 ට නුවර එළියේ අධ්‍යාපන කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවනට ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේදී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර්පත් විවෘත කරන නිලධාරියා විසින් ටෙන්ඩර්කරුවනගේ නම් හා මිළ ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිළ ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමැති විය යුතුය.

7. තවත් අවශ්‍ය විස්තර වෙතොත් නුවරඑළියේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කාර්යාලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සළකනු ලැබේ.

ඒ. ජී. ඒ. මැන්දිස්,
නුවරඑළිය ප්‍රදේශයේ
වැ. බ. ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1970 ජනවාරි මස 19 දින,
නුවරඑළියේ, අධ්‍යාපන කාර්යාලයේදී.

1–484—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

1970 පෙබරවාරි 18 වැනි දින පෙරවරු 10 වන තෙක් මෙහි පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් භාර ගනු ලැබේ :—

| පාඨශාලාවේ නම | වැඩෙහි සවභාවය |
|---|---|
| 1. කෑ/මොරෙවත්ත වි. ... | පාසැල් ගොඩනැගිල්ල. |

**සංලක්ෂ්‍යය :** කෑ=කෑගල්ල දිස්ත්‍රික්කය.

2. කොලඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 2, මැලේ විදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශ කායඝිලයේ රු. 100ක මුදලක් තැන්පත් කර එම කුවිතාන්සිය කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කිරීමෙන් රුපියල් 15,000 කට හෝ ඊට වැඩි ගණනකට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාගී දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970 පෙබරවාරි මස 15 වැනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. (වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 15,000 කට අඩු වැඩ සඳහා ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ නොවෙත්.) චැක්පත් මුදල් ඇණවුම් ආදිය භාර ගනු නොලැබේ. ටෙන්ඩර් තැන්පත් මුදල භාර දීමේ කුවිතාන්සි කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ පාසැල් ගොඩනැගිලි ශාඛාවෙන් හෝ කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගෙන් හෝ ලබාගත හැක. මුදල් භාර දීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ ලියාපදිංචිය ගැන සාක්කි ඉදිරිපත් කරන අයට පමණක් ය.

3. දෙවැනි ඡේදයේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණයට අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශයේ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අනුමත සමිතිවලට ද ටෙන්ඩර් පත්‍ර මේ වැඩ සඳහා එවිය හැක. අනුමත සමිති ටෙන්ඩර් තැන්පත් මුදල් තැබීම අනවශ්‍ය වේ. ඔවුන් දෙවැනි ඡේදයේ සඳහන් මුදල් ප්‍රමාණයේ වැඩ සඳහා ලියාපදිංචි වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර 2 වැනි හා 3 වැනි ඡේදවල සඳහන් පරිදි කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගත් ටෙන්ඩර් පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ඉදිරිපත් කළ යුතුයි. මොහු ගෙන් වැඩය සම්බන්ධ සියළු විස්තර දැනගත හැකි අතර සැලැස්ම ආදියද බලා ගත හැක. තැපෑලෙන් එවන ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් කෑගල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය. තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් පත් කවරයක බහා මුද්‍රා තබා වැඩයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය පැහැදිලිව ලියටෙන්ඩර්කරු හෝ ඔහුගේ නියෝජිතයෙකු විසින් පුද්ගලිකව කෑගල්ලේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාලන සහකාර වෙත භාර දිය යුතුය. එසේ භාර දුන් වහාම ටෙන්ඩරය භාරගත් බවට කුවිතාන්සියක් ඔහු ගෙන් ලබා ගත යුතුයි.

5. 1970 පෙබරවාරි මස 18 වැනි දා පෙරවරු 10 ට කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර ඇත. ටෙන්ඩර් විවෘත කරන නිළධාරියා විසින් ටෙන්ඩර්කරුවන්ගේ නම් හා මිල ගණන් කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් කළ දින සිට සති හයක් ගතවන තුරු තමන් සඳහන් කරන ලද මිල ගණන්වලට එම වැඩය කිරීමට ටෙන්ඩර්කරුවන් කැමති විය යුතුයි.

7. තවත් අවශ්‍ය විස්තරයක් වෙතොත් කෑගල්ලේ ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂකගේ කායඝිලයෙන් ලබා ගත හැක. ටෙන්ඩර් ලියවිලි පරීක්ෂා කර බැලීම සඳහා මෙම කායඝිලයේ තබා ඇත.

8. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ දී 66.9.30 වැනි දිනට පෙර අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් කරන ලද පාසැල් ගොඩනැගිලි වැඩ සම්බන්ධව කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි කිරීම් අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය මගින් කරන ලද ලියාපදිංචි කිරීම් හැටියට මෙම ටෙන්ඩර් දැන්වීමේ කටයුතු සඳහා සලකනු ලැබේ.

ඔලිවර් අබේසේකර,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
කෑගල්ල.

1970 ජනවාරි 19 දින,
කෑගල්ල අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දීය.

1–497—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### කෑගල්ල ප්‍රදේශයේ පාසැල්වලට කිරි විස්කෝතු ගෙන යාම

1969 දෙසැම්බර් මස 26 වෙනි දින රජයේ ගැසට් පත්‍රයේ ඉහත සඳහන් මාතෘකාව යටතේ පළවී තිබූ ටෙන්ඩර් දැන්වීම සම්බන්ධවයි.

එම ටෙන්ඩර් දැන්වීමේ සඳහන් ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය 1970.1.12 වෙනි දින දහවල් 12 වන තෙක් යන්න හා ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 1970.1.13 වෙනි දින පෙරවරු 10.30 යන්න මෙයින් අවලංගු කරන අතර ඒ වෙනුවට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමේ අවසාන දිනය 1970.2.11 වෙනි දින දහවල් 12 ට පෙර යනුවෙන්ද, ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනය 1970.2.13 වෙනි දින පෙරවරු 10.30 ට පෙර යනුවෙන්ද සංශෝධනය විය යුතු බැව් මෙයින් දන්වා සිටිමි.

ඔලිවර් අබේසේකර,
කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂක.

1970. 1. 18 දින,
කෑගල්ල ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

1–819—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශය

කොළඹ, තැ. පෙ. අංක 1434 සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් රාගම උතුරු කොළඹ රෝහලේ මාතෘ නිවාසයේ මතුපිට කාණු යෝජනා ක්‍රමය ඉදි කිරීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් 1970 මාර්තු මස 1 වන දින පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. කොළඹ 7 පිහිටි මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ෆෝරම් වල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රිකා ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැන විසින් 1970 පෙබරවාරි මස 19 වන දින පස්වරු 4 වන තෙක් නිකුත් කරනු ලබන්නේ මතුපිට කාණු ක්‍රම ඉදි කිරීම සඳහා මහජන සෞඛ්‍ය ඉංජිනේරු අංශයේ "ඊ" කොටස යටතේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවන්ට පමණි. ටෙන්ඩර් පත්‍රිකා ලබා ගැනීමට පෙර ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරුතැනගේ නමට අයවන ලෙස

කොළඹ, ලංකා බැංකුවේ හෝ කොළඹින් පිටත නම් කච්චේරියක හෝ රුපියල් පනහක මුදලක් තැන්පත් කොට ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

3. ටෙන්ඩර් පත් ලබා ගැනීම වෙනුවෙන් මුදල් තැන්පත් කිරීමෙන් නිදහස් කොට ඇති පහත සඳහන් සංගම් වලට ද ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කොට ඇති ග්‍රාම සංවර්ධන සමිති.

(ඇ) සමුපකාර සංගම් රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කොට ඇති සමුපකාර සංගම්.

4. ටෙන්ඩර් පත් කොළඹ, ටොරින්ටන් චතුරශ්‍රයේ ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු කාර්යාලයේ තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතුය. නැතහොත් ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුය. ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් ඉහත සඳහන් ස්ථානයේ ටෙන්ඩර් පත් පිළිගැනීමේ බලය ලබා ඇති නිලධරයෙකුට භාර දිය හැකිය. සේවයේ විස්තර ද, ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ලිපිනයද ද, කවරයේ සඳහන් කළ යුතු ය. ටෙන්ඩරය භාර ගත් බවට ඉහත සඳහන් නිලධාරි තැන විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

5. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී සෑම ඉල්ලුම් කරුවෙකුට ම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිළ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියෙහි දී කියවනු ලැබේ. ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමන්ගේ අනුමැතිය අනුව කිසියම් ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර් කරුවකුට අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩරයේ පිටපත පරීක්ෂා කර බැලීම සඳහා අවසර දෙනු ලැබේ.

6. මෙම වැඩයට උවමනා සිමෙන්ති ප්‍රමාණය මිළ දී ගැනීමට අවශ්‍ය අවසර පත්‍රය ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලයෙන් හෝ සමුපකාර තොග වෙළඳ ආයතනයෙන් හෝ ලබා ගැනීම සඳහා නියමිත නිර්දේශය සාර්ථක ටෙන්ඩර්කරු වෙත නිකුත් කරනු ලැබේ.

7. මෙම වැඩය සඳහා අවශ්‍ය, මෙරටින් ලබා ගත නො හැකි බඩු බාහිරාදිය ආනයනය කිරීම සඳහා බල පත්‍ර ලබා ගැනීම ද නිර්දේශ කරනු ලැබේ.

8. වැඩය පිළිබඳ තව දුරටත් විස්තර කොළඹ 7, ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන ගෙන් ලබා ගත හැක.

එස්. ඊ. ජේ. මේදර්,
ප්‍රධාන මහජන සෞඛ්‍ය ඉංජිනේරු තැන.

1970 ජනවාරි මස 18 වන දින,
තැ. පෙ. 1434 දී,
කොළඹ 7.

1–782—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### වායු සමීකරණ යන්ත්‍ර දෙකක් සැපයීම

කොළඹ 5, නාරාහේන්පිට පිහිටි කම්කරු මහා ලේකම් කාර්යාලයේ නව ස්වයංක්‍රීය ටැලිෆෝන් මාරු පොලට, වායුවෙන් සිසිල් කරන, සියල්ල එකට අඩංගු කරන ලද වායු සමීකරණ යන්ත්‍ර දෙකක් සැපයීම් සහ ස්ථාපනය කිරීම සඳහා කොළඹ 1, ලෝටස් පාරේ තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ 5 වෙනි මහලෙහි, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු විසින් 1970 පෙබරවාරි මස 23 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. කොළඹ 1, ලෝටස් පාරේ තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ලේ, 5 වෙනි මහලේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් ෆෝර්ම පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුයි. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමටද, අවශ්‍ය විස්තර දැන ගැනීමට ද පුළුවන.

3. කොළඹ, මධ්‍යම විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර් වෙත ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 50 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1970 පෙබරවාරි මස 16 වෙනි දින දවල් 12 වනතෙක් බලාපොරොත්තු ටෙන්ඩර්කරුවනට ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගත හැකිවේ.

වී. අලගරත්නම්,
ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු.

5 වෙනි මහල,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථාන ගොඩනැගිල්ල,
කොළඹ 1.

1–485—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## බණ්ඩාරවෙල නගර සභාව

වයරින් කිරීම හා අවශ්‍ය විදුලි උපකරණ සහිතව, දෙමහල් පුස්තකාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා අනු පිටපතකින් යුත් සීල් තැබූ ටෙන්ඩර් පත් 1970.2.12 වැනි දින පෙරවරු 9 දක්වා මවිසින් භාරගනු ලැබේ.

රු. 250ක තැන්පත් මුදලක් හා රු. 5ක ටෙන්ඩර් ෆෝර්ම ගාස්තුවක් ගෙවීමෙන් පසුව, රු. 50,000කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට 1970.2.10 වැනි දින පස්වරු 2 දක්වා ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බව දැනුම් දීමෙන් පසු දින 10ක් ඇතුළත ටෙන්ඩර් කළ මුදලින් සියයට 5ක මුදලක් ආරක්ෂිත ඇප වශයෙන් තැන්පත් කර මෙම සභාවත් සමග ගිවිසුම් පතකට අත්සන් තැබිය යුතුයි.

කිසියම් ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය සභාපති සතුය.

මේ පිළිබඳ වැඩි විස්තර කාර්යාලීය වේලාවන් තුළදී මෙම සභාවේ කර්මාන්ත අධිකාරි තැනගෙන් ලබාගත හැක.

ජී. කේ. ලියනගේ
සභාපති,
බණ්ඩාරවෙල නගර සභාව

1970 ජනවාරි මස 2 වැනි දින,
බණ්ඩාරවෙල නගරසභා කාර්යාලයේදීය.

1–761—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

කොළඹ 5, කිරුළ පාරේ අංක 200 දරණ ස්ථානයේ ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලීය සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා මුද්‍රා තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රිකා 1970 පෙබරවාරි මස 11 වෙනි බදාදා පූ. භා. 10 වනතෙක් භාරගනු ලැබේ :—

| (1) තංගල්ල | (2) පොළොන්නරුව |
|---|---|
| යෝජිත ඩිපෝවේ ගොඩනැගිලි, පාරවල් සහ අංගන ඉදිකිරීම. | වැඩමඩුව සහ අතිකුත් ගොඩනැගිලි ඉදිකිරීම |

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල පිළියෙල කොට අනුපිටපතින් යුතුව වෙන වෙනම ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කල යුතුයි. මේ පිළිබඳ අවශ්‍ය සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් පත් යනාදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්ෂා කර බැලීමට පුළුවන. ලංකා ගමනාගමන මණ්ඩලයේ හෝ රජයේ දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරු වැඩ සම්බන්ධයෙන් රු. 2,50,000 ක් හෝ එයට අධික වැය වන කර්මාන්ත සම්බන්ධයෙන් ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. එවැනි කොන්ත්‍රාත් කරුවන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන අනුමත කළහොත් පමණක් අංක 1 සහ 2 කර්මාන්තයන් සඳහා රු. 500 බැගින් වන ටෙන්ඩර් ඇප මුදල් සහ ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ෆෝර්ම ගාස්තු වශයෙන් රු. 25 ක මුදලක් මුදලින් පමණක් ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත තැන්පත් කොට ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කල විට 1970.2.7 වෙනි සෙනසුරාදා මධ්‍යාහ්න 12 දක්වා ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. මෙම කර්මාන්තය සඳහා ටෙන්ඩර් කිරීමට ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඉහත සඳහන් අවශ්‍යතාවයන්ට අතිරේකව රු. 5,00,000 වැය වන සිවිල් ඉංජිනේරු කර්මාන්තයක් අවුරුද්දක් ඇතුළත සතුටුදායක අන්දමින් නිම කර භාරදීමට හැකියාවක් හා තත්ත්වයක් ඇති බැව් ඔප්පු කිරීමට අවශ්‍ය සාධකයන් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

1970 ජනවාරි මස 16 දින,
අංක 200, කිරුළ පාර, නාරාහේන්පිට.

1–492—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

## රාජ්‍ය දැව සංස්ථාව

### මහනුවර, බදුල්ල, රත්නපුරය හා අනුරාධපුරය ප්‍රදේශවල කැලෑවලින් දැව සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත දැක්වෙන ප්‍රදේශයන්ගෙන් දැව සැපයීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265, දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරී කළමනාකාර අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් කිරීමට සුදුස්සෝ :

2. (අ) රු. 1,00,000 ට වැඩි වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා. මේ ටෙන්ඩර් සඳහා කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ පළමුවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 1,00,000 වටිනාකමට දැක්වෙන පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළහැකි අය.

(ආ) රු. 50,000 ට වැඩි හා 1,00,000 අඩු වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා. මේ ටෙන්ඩර් සඳහා කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ පළමුවෙනි, දෙවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 50,000 වටිනාකම දැක්වෙන පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

(ඇ) රු. 30,000 ට වැඩි හා 50,000 අඩු වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා. මේ ටෙන්ඩර් සඳහා කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වූ පළමුවෙනි දෙවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 30,000 වටිනාකම දැක්වෙන පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

(ඈ) රු. 30,000 ට අඩු වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා. පළමුවෙනි දෙවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා ටෙන්ඩරයේ දැක්වෙන වටිනාකමට පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

3. මෙහි යට දක්වා ඇති වටිනාකමට දැව සැපයීමට සහ අනවශ්‍ය දැව ටෙන්ඩර් දැන්වීමේ විග්‍රහකර ඇති මිළට මිළදී ගැනීම සඳහා ටෙන්ඩර්.

(1) මහනුවර ප්‍රදේශය :

(අ) මහනුවර දිසාපතිගේ පාලන දිස්ත්‍රික්කයට අයත් රන්දෙනිගල යෝජනා ක්‍රමයට යටවන ප්‍රදේශය.
කඳන්, සිල්පර හා ඉරු ලී සැපයීම රු. 1,00,000 වටිනාකමට.

(ආ) නුවරඑළිය දිසාපතිගේ පාලන දිස්ත්‍රික්කයට අයත් රන්දෙනිගල යෝජනා ක්‍රමයට යටවන ප්‍රදේශය.
කඳන්, සිල්පර හා ඉරු ලී සැපයීම රු. 75,000 වටිනාකමට.

(ඇ) අමුණුතැන්න 'බී' වැඩබිම.
කඳන් සැපයීම රු. 10,000 වටිනාකමට.

(ඈ) වැලිතුඩුව වැඩබිම.
කඳන් සැපයීම රු. 5,000 වටිනාකමට.

(ඉ) වැ කඩ වැඩබිම.
කඳන් සැපයීම රු. 15,000 වටිනාකමට.

(ඊ) කුමාරගල වැඩබිම.
කඳන් හා සිල්පර සැපයීම රු. 15,000 වටිනාකමට.

(උ) මැදපිහිල්ල වැඩබිම.
කඳන් සැපයීම රු. 4,000 වටිනාකමට.

(2) රත්නපුර ප්‍රදේශය :

(අ) උඩවලවේ හි කිරල් ආර වැඩබිම.
කඳන් සැපයීම රු. 15,000 වටිනාකමට.

(ආ) දිවුලාන වැව ව්‍යාපාරය.
කඳන් සැපයීම රු. 50,000 වටිනාකමට.

(ඇ) උඩවලවේ හි කොන්කටු ආර
කඳන් සැපයීම රු. 10,000 වටිනාකමට.

(ඈ) උඩවලවේ හි මීගහ ආර වැඩබිම.
කඳන් සැපයීම රු. 10,000 වටිනාකමට.

(ඉ) සමනල වැව අංක I
සිල්පර, කඳන් හා ඉරු ලී සැපයීම රු. 50,000 වටිනාකමට.

(ඊ) සමනල වැව අංක II
සිල්පර, කඳන් හා ඉරු ලී සැපයීම රු. 60,000 වටිනාකමට.

(උ) මැණික්දොල මූකලාන.
කඳන් හා ඉරු ලී සැපයීම රු. 25,000 වටිනාකමට.

(3) අනුරාධපුර ප්‍රදේශය :

(අ) වුන්දන්කාඩු රක්ෂිත වනය. අංක I.
කඳන් සැපයීම රු. 30,000 වටිනාකමට.

(ආ) වුන්දන්කාඩු යෝජිත රක්ෂිත අංක I.
කඳන් සැපයීම රු. 30,000 වටිනාකමට.

(ඇ) වුන්දන්කාඩු යෝජිත රක්ෂිතය අංක II.
කඳන් සැපයීම රු. 50,000 වටිනාකමට.

(ඈ) බුලුගල කන්ද.
කඳන් සැපයීම රු. 15,000 වටිනාකමට.

(ඉ) රතාවේ කන්ද.
කඳන් සැපයීම රු. 15,000 වටිනාකමට.

(ඊ) අන්දර වැව අංක I.
කඳන් සැපයීම රු. 50,000 වටිනාකමට.

(උ) අන්දර වැව අංක II.
කඳන් සැපයීම රු. 30,000 වටිනාකමට.

(ඌ) සින්හාරගම.
කඳන් සැපයීම රු. 15,000 වටිනාකමට.

(එ) කෙඩිතොක්කු වැව.
කඳන් සැපයීම රු. 10,000 වටිනාකමට.

4. මෙහි යට දක්වා ඇති වටිනාකමට දැව සැපයීම සඳහා ටෙන්ඩර්

(1) බදුල්ල ප්‍රදේශය :

(අ) කතිරවෙලි ර. අ. කැ.
ඉරුලී, කඳන් හා සිල්පර සැපයීම රු. 50,000 වටිනාකමට.

(2) රත්නපුර ප්‍රදේශය :

(අ) කුඹුරුගමුව රක්ෂිත වනය.
කඳන් සැපයීම රු. 50,000 වටිනාකමට.

(ආ) බෙක්කවෙල අංක 6.
කඳන්, සිල්පර හා ඉරු ලී සැපයීම රු. 1,00,000 වටිනාකමට.

(ඇ) දෙල්වල යෝජිත රක්ෂිතය.
කඳන් හා සිල්පර සැපයීම රු. 75,000 වටිනාකමට.

(ඈ) මොරහෙල රක්ෂිත වනය.
කඳන් හා සිල්පර සැපයීම රු. 3,00,000 වටිනාකමට.

(3) අනුරාධපුර ප්‍රදේශය :

(අ) මහවැලි ගඟ උතුරු රක්ෂිතය.
කඳන් සැපයීම රු. 50,000 වටිනාකමට.

5. 1970 පෙබරවාරි මස 15 වැනි දින අ. භා. 2 ට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

6. 1970 පෙබරවාරි මස 16 වැනි දින පූ. භා. 11 ට ටෙන්ඩර් ආකෘති පත්‍ර භාර ගැනීම අවසන් කරනු ලැබේ.

වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ ඒ ඒ ප්‍රාදේශීය කළමනාකාරවරුන්ගෙන් හෝ කොළඹ 5 තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ ක්‍රියාකාරී කළමනාකාරගෙන් හෝ ලබාගත හැකිය.

ඒ. සී. ආර්. රත්නරාජා,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.

1970 ජනවාරි මස 29 වැනි දින,
රාජ්‍ය දැව සංස්ථාව,
ක්‍රියාකාරී කළමනාකාර අංශය,
265, තිඹිරිගස්යාය පාර,
කොළඹ 5.

1–487—70.1.29 දින අංක 14,891 දරන ගැසට් පත්‍රය

අංකය : එල්. එම්. 1505(2)

## මහනුවර දිස්ත්‍රික්කයේ තැනීම් වැඩ

මහනුවර දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1970 පෙබරවාරි මස 19 වැනි දින පස්වරු 2.30 දක්වා කොළඹ, තැ. පෙ. අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

| වැඩයේ ස්වභාවය | ලියා පදිංචි විය යුතු මුදල |
|---|---|
| 1. පබරල්දෙනිය ජනපද පාර ගල් අතුරා තාර දැමීම | රු. 30,000.00 |
| 2. බුළුගහතැන්න ජනපද පාර තැනීම | රු. 30,000.00 |
| 3. මාම්පිටිය (රාජගිරිය) පාර ගල් අතුරා තාර දැමීම | රු. 35,000.00 |
| 4. ගොරකාදෙනිය ජනපද පාර ගල් අතුරා තාර දැමීම | රු. 25,000.00 |
| 5. නිව්අංගම්මන ජනපද පාරේ ඉතිරි වැඩ | රු. 20,000.00 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙන් සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි ගණනකට රජයේ දෙපාර්තමේන්තුවල කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියා පදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති සහ සමුපකාර සමිතිවලට සහ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ටද 1970.2.15 වැනි දින දවල් 12 තෙක් ටෙන්ඩර් ෆෝරම මහනුවර කච්චේරියෙන් නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝරම අපේක්ෂකයින් විසින් මහනුවර කච්චේරියේ තමන් විසින් කරන වැඩය වෙනුවෙන් රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් මහනුවර දිසාපති වෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ග්‍රාම සංවර්ධන සමිති කම්කරු සමිති සහ සමුපකාර සමිති ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීම අනවශ්‍ය ය. චෙක්පත්, මුදල් ඇණවුම් සහ තැපැල් ඇණවුම් ආදිය භාරගනු නොලැබේ.

4. ටෙන්ඩර් පෝරම සම්පූර්ණ කර පිටපත් දෙකකින් යුක්තව ලේඛනගත තැපැලෙන් යැවිය යුතුයි. ටෙන්ඩර් බහා එවන කවරය මුද්‍රාතැබිය යුතු අතර කවරයේ වම් උඩ කෙළවරේ වැඩෙහි නම ලියා තිබිය යුතුයි. ටෙන්ඩර් පෝරම තැපැලෙන් නොඑවන්නේ නම් ගාළු මුවදොර මහා ලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුයි.

5. 1970. 2. 19 වැනි දින ප. ව. 2.30 ට ඉහතකී 357 දරණ කාමරයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

6. මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ කරවා ගැනීමට පුහුණු හා නුපුහුණු දෙවර්ගයේම ලාංකික කම්කරුවන් පමණක් යෙදවීමට කොන්ත්‍රාත්කරු එකඟ විය යුතු අතර එවැනි කම්කරුවන් හැකි තරම් දුරට බඳවා ගත යුත්තේ වැඩය කරන ප්‍රදේශයේ සිටින අය අතුරෙනි.

කොන්ත්‍රාත්තුවේ මේ කොන්දේසි සපුරාලීමට කොන්ත්‍රාත්කරු යම්කිසි විධියකින් අසමත් වුවහොත් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට එය තුඩුදෙනවා ඇත. එහෙත් කොන්ත්‍රාත්තුවට එලඹෙන නිලධාරියා විසින් විශේෂ අවස්ථාවලදී ඉඩම් වාරිමාර්ග සහ විදුලි බල අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්ගේ එකඟත්වය ඇති නිශ්චිත ලියවිල්ලකින් එකී නිලධාරියා අනුමත කරන ලද ලාංකික නොවන කම්කරුවන් නියුක්ත කරවීමට කොන්ත්‍රාත්කරුට බලය දිය හැකිය.

එවැනි ලිඛිත බලයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික කම්කරුවන් යෙදවීම තහනම් වන අතර එය කොන්ත්‍රාත්තුව කඩ කිරීමක් ලෙස සලකනු ලැබේ.

